

# නොසිඳි නිම්නය

## ඝාතනයෙන් නොනැවතුණු ජනබලය

රෙජී රණතුංග

ජනාධිපති ලේකම් කාර්යාලය
25 JAN 2005
පුස්තකාලය

ජනාධිපති ලේකම් කාර්යාලයේ පුස්තකාලය සඳහා පරිත්‍යාග කරමි.

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය
ප්‍රවේශ අංකය 3151
වර්ග අංකය 923

| | |
|---|---|
| ප්‍ර. අංක | 3151 |
| වර්ග අංකය | 923 |
| දිනය | 2005.01.25 |

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

Acc NO 3151

Class No 923.
541.8

# නොසිඳි නිම්නය

## ඝාතනයෙන් නොනැවතුණු ජනබලය

රෙජී රණතුංග

ස්තුතිය :- ලිපි ලේඛන සොයාදුන් සැමට සහ මුද්‍රණය සඳහ
අනුග්‍රහය සැපයූ ඒ. පී. අනිල් සරත් කුමාර මහ

ACC. NO. 3151
CLASS NO.
DATE.

ප්‍රථම මුද්‍රණය : 2005 ජනවාරි

සංස්කරණ සහාය : ප්‍රදීප් වීරේරත්නසේකර
මෙරිල් පෙරේරා,
නිමල් පද්මසිරි

ප්‍රකාශනය : රෙජී රණතුංග අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදල

මුද්‍රණය : හංසප්‍රභා ග්‍රැෆික්ස් මුද්‍රණ සහ ප්‍රකාශන,
කොරසෙ, උඩුගම්පොල.
ටෙලි : 0777-445301



දේශයේ අසහාය ජන නායක
දිවංගත අග්‍රාමාත්‍ය ගරු
**එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණෝ**

## පිදුම...

ජාතියක්, දේශයක් පුබුදු කල දෙනෙත මෙලොව එළිය දුටුවේ අද වැනි දිනක ය. ජනතාවටත්, මව්බිමටත් නව යුගයක් උදාකොට පොඩි මිනිසාගේ ලොකු බලාපොරොත්තු ඉටු කොට, ඒ වගේම පොඩි මිනිපුත්ට අගමැති, මැති ඇමති තනතුරු, ආචාර්ය, මහාචාර්ය ආදී උසස් තැන් වලට යාමට දොරගුළු විවර කල, ලාංකීය දේශපාලනයේ මහ දාර්ශනිකයාණන් වූ, ජාතියේ අසහාය නායක එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් දේශයට තිළිණ කල ශ්‍රේෂ්ඨ නායකත්වය
ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිනි
**චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය**
වෙත මෙම කුඩා ග්‍රන්ථය ගෞරවාදරයෙන් පිරිනැමේ.

# පෙරවදන

1950 වන විට දාහතර හැවිරිදි කොලුගැටයකු වූ මට ල
දේශපාලනයෙහි ප්‍රචලිත වූ සුවිශේෂ සිද්ධීන් රැසක් මතකය. 1948
ලංකාව බ්‍රිතාන්‍යයෙන් නිදහස් රාජ්‍යයක් ලෙස ප්‍රකාශ කිරීම, 1947
එක්සත් ජාතික පක්ෂය පිහිටුවීම, ඩී. එස්. සේනානායක මහතා
නායකත්වයට පත්වීම, 1947 මහ මැතිවරණය 1951 දී ශ්‍රී ලංකා නිද
පක්ෂය පිහිටුවීම, එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා එහි ප්‍ර
සභාපතිවරයා සහ නායකයා ලෙස පත්වීම, 1952 දී ඩී. එස්. සේනානා
මහතා අශ්ව පිටින් වැටී මියයාම, ඩඩ්ලි සේනානායක මහතා අගම
වීම, 1953 මහා හර්තාලය 1956 ජනතා ජයග්‍රහණයෙහි ප්‍රතිඵලය
පොදුජන යුගය බිහිවීම ආදිය මගේ ගැටවර වියේ මා ඇසූ දුටු දේශපා
සිදුවීම් විය.

මේ සියල්ල තුල තිබූ දේශපාලන සමාජ පරිසරය දෙස බැලීම
ලාංකීය මහා ජන ගංගාව ගැලූ දේශපාලන දිශාව තීරණය කලහොත්
මහා ජන ගංගාව ගැලුවේ එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණ
දෙසට බව තර්කයෙන් තොරව පිළිගැනීමට සිදුවේ. එතුමන්ගෙන් දෙවැ
ජාතියේ මාතාව වූ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය කරා ඒ ම
ජන ගංගාව යොමු විය. ඒ ප්‍රගතිශීලී දේශපාලනයේ දෙවන ජනයුගය

තෙවනුව 1993 දී ලංකා අග්‍රාමාත්‍ය යුවලගේ දයාබර කණ
දියණිය, ලක් ජන දියණිය චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනි
දෙසට ඒ මහා ජන ගංගාව ගැලිය. එහෙයින් මේ ජන ගංගාව කිසිදා ද
නොගියේය. බණ්ඩාරනායකවරුන් හට එය නොසිඳි ජන ගංගාවක්
විය. අදටත් ගලන්නේය.

මේ මහා ජන ගංගාව ගලන මාවත දසත විහිදී ගිය මහා ජ
නිම්නයක් ලෙස මම දුටුවෙමි. මෙම කුඩා පොත් පිංච "නොසි
නිම්නය" යැයි නම් කිරීමට අදහස් කලේ එබැවිනි.

මේ පොත් පිංච සැකසීමේදී තොරතුරු සපයමින් උපකාර ක
සැමටත් මුද්‍රණ කටයුතුවලට අනුග්‍රහය සැපයූ අයටත් මාගේ පෞද්ගලි
ස්තුතිය හිමි වේ.

**- රෙජී රණතුංග**

180 ඒ, මීනුවන්ගොඩ පාර, උඩුගම්පොල.
2005 ජනවාරි 08

# මතකය සමඟ පිළිසඳරක්.....

"නොසිඳි නිම්නය" ලෙස
මා දකින්නේ එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක
ශ්‍රීමතාණන් ඝාතනයෙන් නොනැවතුන
ලාංකිය ජනතා බලවේගය ගමන් කරන මාවතයි.
ඒ ජනතා බලවේගය තුල ගැවසී ඔවුන් හා
මුසුව දේශපාලනයෙහි නිරත වූ මා
ප්‍රගතිශීලී දිශාවට ක්‍රියාත්මක වන්නා වූ දේශපාලන ප්‍රවාහයන්
මේ මාවත තුළ බහුලව දක තිබේ.

මගේ මතකය තුළ ගොඩනැගෙන්නා වූ ආවර්ජනයේ
ඊට අදාල වැදගත් දෑ රාශියක් ගැබ්ව තිබේ.

අතීත ආවර්ජනය ගොඩනැගෙන්නේ හුදකලාව තුලිනි.
ආවර්ජනය මගේ හුදකලාව ඈතට තල්ලු කර දමයි.

ජීවිතය සිනමා පටයකට ගොනුකොට
ප්‍රදර්ශනය කරන්නාක් වැනිය.
තමා පෙරලා ජීවිතය කියවීමේදී
යම් යම් පරිච්ඡේදයන් තුල රුචි-අරුචි
දෙකම ගැබ්ව ඇතත් දේශපාලනය
තම ජීවිතය කොට ගත් පුද්ගලයෙකු හට
මතකය සමහ පිළිසඳරක යෙදිය හැක්කේ
තමා ජීවත් වූ දේශපාලන සමාජ පරිසරය තුලය.

එහෙයින් මෙහි අන්තර්ගත සිද්ධීන්, වාර්තා, තොරතුරු
මා ඇසූ දුටු, මා අත්විඳි දේ වෙයි.

# ලාංකීය දේශපාලනය පිළිබඳ මතකයෙන් කෙටි සටහන් පෙලක්......

ලංකා දේශපාලනයේ ඉතිහාසය බෙහෙවින් සංකීර්ණ සිද්ධීන් සමඟ විකාශය වූ එකකි. විදේශ ආධිපත්‍යයට ගැති බටහිර බලවතුන්ගේ ග්‍රහණයෙන් අපේ මව්බිම ගලවා ගැනීමට පුරෝගාමී වූ දේශ හිතෛෂී පුද්ගලයින් කීප දෙනෙකුම වූහ. ඔවුහු දේශයේ, ජාතියේ ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් කැප වූ තරම අනුව ජනතාවගේ සිත් සතන් තුළ තවමත් අමරණීය ලෙස පිවත් වෙති.

මේ අතරින් දිවංගත අග්‍රාමාත්‍ය ගරු එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් ලාංකීය ප්‍රතිගාමී දේශපාලනයට එරෙහිව යුග පෙරළියක් කරමින් ජනතාවට ප්‍රගතිශීලී දේශපාලනය හිමිකර දුන් ශ්‍රේෂ්ඨ ජන නායකයා විය.

1930 - 45 ක් වූ කාලයේ අවශ්‍යතාවය වූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් රටට ලබා දීම අවශ්‍යයයි යන්න එතුමාගේ මතය මෙන්ම ඒකායන උත්සාහයද විය.

එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිඳුන් එක්සත් ජාතික පක්ෂය බිහිකිරීමට පුරෝගාමීව කටයුතු කල දේශපාලනඥයෙකි. බ්‍රිතාන්‍යයෙන් නාම මාත්‍ර නිදහසක් ලැබූ පසුවත් තව දුරටත් පැවති යටත් විජිත රාමුව හා ධනවාදී ආර්ථිකයෙන් දේශය නව ප්‍රගතිශීලී මාවතකට ගැනීමට එක්සත් ජාතික පක්ෂයේ එවකට සිටි සෙසු නායකයන් ක්‍රියා නොකරන බව තේරුම් ගන්නා තුරුම එතුමා එ.ජා.ප. යේ සිටියේය. පොදු ජන සුභසාධනය, දේශයේ ආරක්ෂාව හා සාමය, ජාතික සමගිය, ප්‍රජාතන්ත්‍රවාදයේ සුභවාදී අරමුණු, ජනතා අපේක්ෂා, දේශයේ සංවර්ධනය එජාපයෙන් කිසි කලෙක ඉටු නොවුනු දුටු එතුමන් එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් විය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බිහිවීමට හේතු වූයේ එබඳු පසුබිමකි.

එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් වී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවා, ප්‍රගතිශීලි දේශපාලන නායකයන් රැසක්ම තම පක්ෂයේ ක්‍රියාකාරින් ලෙස එකතු කර ගැනීමට බණ්ඩාරනායක මැතිඳුන් සමත් විය. 1945-52 කාලයේ ලංකා දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවූ විශේෂ සිදුවීම් කිපයක් මෙහිදී මතක් කරමි. මේ සිදුවීම් තුලින් කිහිපයක් මෙහි ලා සඳහන් කළහොත්,

(1) 1945 දෙවැනි ලෝක යුද්ධය නිම කරමින් ලංකාවට සෝල්බරි ආණ්ඩු ක්‍රමයක් මහා බ්‍රිතාන්‍යය විසින් නිර්දේශ කරනු ලැබීම.

(2) 1947 දී ප්‍රථම වරට එ.ජා.ප. අපේක්ෂකයෙකු ලෙස එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා මැතිවරණයට ඉදිරිපත් වීම. එම මැතිවරණයෙන් විශිෂ්ට ජයග්‍රහණයක් ලබා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට තේරී පත්වී එම රජයේ සෞඛ්‍ය,පළාත් පාලන අමාත්‍ය සහ සභා නායකවරයා පාර්ලිමේන්තුවේ ව්‍යක්ත කථිකයෙක් ජනතාව වෙනුවෙන් ඉදිරිපත් වීම.

(3) එක්සත් ජාතික පක්ෂයෙන්, එහි තනතුරුවලින් ඉල්ලා අස්වීම.

(4) 1951 සැප්තැම්බර් 02 දා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවීම.

(5) 1952 දී ශ්‍රී.ල.නි.ප ය ප්‍රථම වරට මැතිවරණයකට ඉදිරිපත් වීම. අත්තනගල්ල ආසනයට එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිඳුන් ශ්‍රිලනිප අපේක්ෂකයා ලෙස ඉදිරිපත් වී ආසනයෙන් විශිෂ්ඨ ජයග්‍රහණයක් ලබා ගැනීම.

එක්සත් ජාතික පක්ෂයේ සිට එතුමා ක්‍රියාත්මක කරන්නට හැදූ ජනතාවාදී වැඩ පිළිවෙලට එහි නායකයෝ ලබා දුන්නේ අඩු සහයෝගයකි. පැරණි යටත් විජිත රාමුව තුළම රැඳෙමින් අපේ රට පුංචි එංගලන්තයක් ලෙස පවත්වා ගෙන යෑමට ඩී. එස්. සේනානායක මහතා ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂ නායකයෝ කැමැත්ත දක්වූහ.

බණ්ඩාරනායක ශ්‍රීමතාණන් මේ රටේ ආර්ථික සමෘද්ධිය ඇතිකිරීමට ක්‍රමවත් සැලැස්මක් යටතේ රට සංවර්ධනය කළ යුතු බව එහි ඇති වැදගත්කම හා අවශ්‍යතාවය බොහෝ අවස්ථාවලදී පෙන්වා දුන්නේය. එපමණක් නොව ඒ සඳහා යෝජනා රැසක්ම ඉදිරිපත් කලේය.

එම යෝජනා අතර ඉතාමත් වැදගත් වූ යෝජනා රැසක් 1948 දී ක්‍රම සම්පාදන පිළිබඳ ඇමති මණ්ඩල අනුකාරක සභාවට බණ්ඩාරනායක මැතිඳුන් විසින් සංදේශයක් මගින් ඉදිරිපත් කෙරිණි. පහත දක්වෙන් මෙම යෝජනා වලිය පිළිබඳ අධ්‍යයනය කර විමර්ශනයකට ලක් කල විට පෙනී යනුයේ රටේ යටත්විජිත රාමුව තුළට ගොනුවී තිබුණු ආර්ථික හා පරිපාලනය ධනවාදයෙන් බැහැර මාවතකට ගැනීමට තබන්නා වූ මූලික පියවර කීපයක් මේ යෝජනාවලිය තුළ ගැබ්වී ඇති බවයි.

එම යෝජනාවලිය මෙහිලා ඉදිරිපත් කිරීම වැදගත්ය.

1. ගම් පළල් කිරීම සඳහා දැනට වඩා විශාල ලෙස ඉඩම් පවරා ගැනීම හා එම ඉඩම් සමූපකාර හා සාමූහික පාලනයකට පත් කිරීමේ ඉඩකඩ සොයා බැලීම.

2. සමාජ සේවා කොමිසමේ වාර්තාව නොපමාව ක්‍රියාත්මක කිරීම.

3. අවම සීමාවකින් ඉහළ කුඹුරු ඉඩම් ජනසතු කිරීම.

4. කජු, උක්, ධීවර, ලුණු හා පොහොර කර්මාන්ත ආරම්භ කිරීම.

5. පළාත් පාලන ආයතන වලට වැඩිපුර මුදල් වෙන් කිරීම.

6. රජයෙ වැඩ දෙපාර්තමේන්තුව විමධ්‍යගත කිරීම.

7. ආරක්ෂාව සම්බන්ධව බ්‍රිතාන්‍ය හමුදාවන්ගේ පිහිට මත රැඳී සිටීම වැලකීමට අපේම ත්‍රිවිධ හමුදාවක් පිහිටුවීම.

8. එක්සත් ජාතීන්ගේ සංවිධානයට බැඳීම ඉක්මන් කිරීම. ආසියාතික කලාපීය ආරක්ෂක ගිවිසුමක් ඇති කර ගැනීම.

9. රාජ්‍ය බැංකුවක් වහාම පිහිටුවීම.

10. ධනය සමාන ලෙස බෙදී යන ආකාරයට බදු ක්‍රමය ප්‍රතිසංවිධාන කිරීම.

11. විදේශිකයන් මෙරට පැමිණීම සීමා කිරීම හා මෙරට සේවය කරන ලාංකික නොවන පිරිස් සඳහා සියයට ප්‍රමාණයක් නියම කිරීම.

12. රාජ්‍ය සේවකයන්ට සම්පූර්ණ වෘත්තීය අයිතිය ඉල්ලීම් නැවත සලකා බැලීම.

13. දුප්පත් ළමයිනට නිදහස් අධ්‍යාපනයේ ඵලය ලැබීමට දැනට වඩා වැඩිපුර අවස්ථා සැලසීම සහ රජයේ හා අනෙක් කටයුතු ස්වභාෂා වන්ගෙන් ගෙන යෑම සඳහා නොපමාව කටයුතු කිරීම.

14. ගමනා ගමනය පසුව ජනසතු කිරීමේ අරමුණ ඇතිව පළාත් පාලන ආයතන වලට තමන්ගේ බස් සේවයක් පවත්වාගෙන යෑමට වහාම ඉඩදීම සහ දැනට ඇති (පුද්ගලික) සමාගම් රජයේ පාලනයත් මහජන සහභාගිත්වයත් ඇති සංයුක්ත මණ්ඩල බවට පත් කිරීම.

15. වෙළඳාම ලාංකිකයන් අතට පත් කිරීම සඳහා සමුපකාර ව්‍යාපාරය සංවර්ධනය කිරීම.

16. අඩු වශයෙන් ජනතාවට අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන් හා රටේ ප්‍රධාන නිෂ්පාදනයන් ආනයනය හා අපනයනය රජය යටතට ගැනීම.

17. ජාතික ධනය වර්ධනය කිරීම.

එක්සත් ජාතික පක්ෂ රජය මේ යෝජනා දෙස නිකමටවත් උනන්දුවක් නොදක්වා ක්‍රියා කළේය. එහෙත් ශ්‍රීලංකා නිදහස් පක්ෂය පිහිටුවූ පසුව බණ්ඩාරනායක මහතා මෙම යෝජනාවලියේ බොහොමයක් ක්‍රියාවට නංවාලමින් සිය ජනතා සේවය පෝෂණය කළේය.

බණ්ඩාරනායක මැතිඳුන් මුලසිටම අධිරාජ්‍ය විරෝධී හැගීම් වලින් යුක්තව ක්‍රියා කළ පුද්ගලයෙකු විය.

එදා බණ්ඩාරනායක ශ්‍රීමතාණන් අනුගමනය කළ ප්‍රතිපත්ති සමුදායෙහි ඇති ඉතාම වැදගත් බව අද නව පරපුරේ කාටත් වැටහි යායුතු යැයි මම තරයේ විශ්වාස කරමි. අද ජාතික ප්‍රශ්නයක් බවට පත්ව ඇති උතුරු නැගෙනහිර ප්‍රශ්නය ඇතිවීමට ඉඩක් බණ්ඩාරනායක මැතිඳුන් ගෙන ගිය හා අදහස් කල වැඩ පිළිවෙල ඉදිරියට ගෙන ගියා නම් ඇතිවන්නේ නැත. එතුමා පළමුව භේද බින්නව සිටි ප්‍රධාන ජාතිය වන සිංහලයින් එකමුතු කිරීමටත් ඒ තත්වය තුළින් අනෙකුත් සුළු ජාතින්ද සමගි බැම්මට බැද තැබීමටත් නිරන්තරයෙන් උත්සාහ කළේය.

පසු කාලයේදී එතුමා ජාතික සංගමයත් සමග එකතුව එක්සත් ජාතික පක්ෂය බිහිකිරීමට කටයුතු කළේය. එහෙත් පසු කාලීනව බණ්ඩාරනායක මහතාගේ මතවාදයන් එ. ජා. ප යේ මතවාදයන් අතර ගැටුම් ඇතිවිය. එහි ප්‍රතිඵලය වුයේ 1951 ජූලි 12 වැනිදා පැවැති අය වැය ආරම්භක දිනයේදි එක්සත් ජාතික පක්ෂයෙන් හා අමාත්‍ය මණ්ඩලයෙන් ඉවත්ව විපක්ෂයේ අසුන් ගැනීමයි. ඔහු සමග ඒ. පී. ජයසූරිය, ඩී. එස්. ගුණසේකර, බර්නාඩ් අලුවිහාරේ, ඩී. ඒ. රාජපක්ෂ, හැන්රි අබේවික්‍රම යන මන්ත්‍රීවරුද එ.ජා.ප. ය අත්හැර පැමිණියහ.

තමා සෞඛ්‍ය හා පළාත් පාලන ඇමති ධූරයෙන් අස්වුණ බව ප්‍රකාශ කරමින් එතුමා පාර්ලිමේන්තුවේදී ඓතිහාසික කතාවක් කළේය. එම කතාවෙන් එතුමා තමා එක්සත් ජාතික පක්ෂයට එක් වුයේ කුමන පරමාර්ථයක් පෙරදැරි කරගෙන දැයි ඉතාමත්ම පැහැදිලි ලෙස ප්‍රකාශ කර සිටියේය. එපමණක් නොව නව පරමාර්ථයන් සහ අභිලාශයන් ඉටුකර ගැනීමට නොහැකි වූ ආකාරයද එතුමා සිය කථාව තුළින් පෙන්නා දුන්නේය.



## එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් එක්සත් ජාතික පක්ෂයෙන් ඉල්ලා අස්වීම....

"මමත් එක්සත් ජාතික පක්ෂය පිහිටුවීමට හවුල් වූ තව බොහෝ දෙනෙක් අරමුණු කර ගත් පරිදි ඉතා ඉක්මනින් එය ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී පක්ෂයක් බවට වර්ධනය වනු ඇතැයි මම බලාපොරොත්තු වූනෙමි. මේ බලාපොරොත්තුව සම්බන්ධව කා තරමක් කනස්සල්ලට පත්ව සිටින බවට මා විසින් අවංකවම සාපොච්චාරණය කළ යුතුය. විරුද්ධවාදීන් විසින් එල්ල කරන ලද ඇතැම් චෝදනා සාර්ථක ලෙස නිෂ්ප්‍රභා කිරීමට තමන්ගේම වැරදි නිසා යූ.ඇන්.පිය අසමත් විය. එහෙයින් අප මුලදී බලාපොරොත්තු වූ අන්දමින් මේ රටේ ජනතාවගේ පොදු විශ්වාසය දිනා ගැනීමට යූ.ඇන්.පිය අසමත් විය."

"ප්‍රතිගාමී හා විප්ලවවාදී නොවන්නාවූද සාමය හා චීනය ගරුක වූද, ඒ අතරම ජනතාවගේ- විශේෂයෙන් දුප්පතුන්ගේ තත්වය විවිධ ආකාරයෙන් නගාලනු දක්නට කැමැති වූද, විශාල ජන සමූහයක් මේ රටේ සිටිති."

**- එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්**

බණ්ඩාරනායක මැතිඳුන් එක්සත් ජාතික පක්ෂයෙන් අස්වීම එජාපයට දරාගත නොහැකි පාඩුවක් විය. ඒ නිසා ඩී. එස්. සේනානායක මහතා ප්‍රමුඛ එජාප නායකත්වයේ ප්‍රතිගාමී කොටස් මෙන්ම මේ රටේ පුවත්පත් වලින්ද එතුමාට පහර පිට පහර එල්ල විය. විශේෂයෙන්ම එතුමා එජාපයෙන් අස්වීමට හේතුවූ කරුණු විකෘති කර දක්වමින් ගෙන ගිය ප්‍රචාරය බලවත් විය. අගමැතිකම නොලැබෙන නිසා එජාපය අත්හැරීමට බණ්ඩානායක මහතා පෙළඹී හේතුව බව එවකට ආණ්ඩු පක්ෂයේ මැති ඇමතිවරු රට පුරා කියාගෙන ගියහ.



# ඉල්ලා අස් වූ පසු
# මුහුණ පෑ අභියෝග..

"මගේ ඉල්ලා අස්වීමට හේතුන් වශයෙන් මහජනයා නොමග යවන සුළු කතා පතුරුවමින් අගමැතිවරයා (මහාමාත්‍ය ඩී. එස්. සේනානායක) සහ ඔහුගේ ඇතැම් අනුගාමිකයින් රට වටා යනු දකීම මගේ බලවත් කණගාටුවට කරුණකි. නොයෙක් ස්ථානයන්හිදී විවිධ වූ පරස්පර විරෝධී ප්‍රකාශයන් කරන බැවින් අගමැතිවරයා තමා කතා කරන්නේ මොනවාදැයි නොදන්නා බවක් පෙනේ. මා මගේ ඉල්ලා අස්වීමේ ලිපිය යැවූ අවස්ථාවේ "ඔබට මෙම පියවර ගැනීමට අවශ්‍යවීම ගැන මම කණගාටු වෙමි. දේශපාලන වශයෙන් අප අතර මොන මත බේද තිබුණත්, අපගේ පුද්ගලික සබඳතාවය දිගටම සුහදව පවතිනු ඇතැයි මා තුළ සැකයක් නැත." යනුවෙන් අගමැතිවරයා පිළිතුරු එව්වේය. මගේ ඉල්ලා අස්වීම දේශපාලන මත බේද උඩ සිදුවූවකැයි යන තත්වය ඔහු පිළිගත් බව මෙයින් පෙනී යයි. මේ ළඟදී ගම්පොල පැවැති රැස්වීමකදී මා ඇතැම් කපටි පුද්ගලයින් විසින් අටවන ලද උගුලකට අසුවීමෙන් මෙම පියවර ගත් අවංක පුද්ගලයෙක් හැටියට අගමැතිවරයා පැවසූ බවක් පළවිය. මා සූක්ෂම ලෙස ඇටවූ උගුලකට අසුවූ නරියෙකුට සමාන කළ ඔහු මට එයින් බේරෙන්නට ලැබෙන්නේ වලිගය නැතිව යයි කියා ඇත."

**- එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්**



## ජනතාව වෙනුවෙන් වූ හෘද සාක්ෂිය

"සංචාරකයෙකුගේ ඇසින් බලන කල ලංකාව අග්නිදිග ආසියාවේ අනෙක් බොහෝ රට වලට වඩා දර්ශනීය බව ඇත්ත විය හැකිය. එහෙත් මහජනයාගෙ පැත්තෙන් බලන කල අසහනය හා කලකිරීම පිළිබඳව දවසින් දවස වැඩෙන හැඟීමක් පවතී. යටත් විජිත පාලනය යටතේ පසුගිය වසර 25 තිස්සේ අප විසින් අනුගමනය කරන ලද මූලික චින්තන සහ ක්‍රියා මාර්ගයේ කිසිම වැදගත් වෙනසක් ඇතිවී තිබේ යැයි මට නොපෙනේ. නිදහස් රටක විශේෂයෙන්ම වර්තමාන ලෝක තත්වය අනුව බලන කල මෙය ඉතාම අසතුටුදායක ය. ඛේදජනක ය. ගෞරවනීය ආකාරයෙන් සහ මෙරට උපරිම යහපතට සරිලන ආකාරයෙන් මගේ අදහස් හා මේ ආණ්ඩුවේ සමහරෙකුගේ අදහස් හා ගැලපීමක් ඇති කරගත හැකි වෙතැයි මම දිගුකලක් බලාපොරොත්තු වුණෙමි. මෙම ප්‍රතිවිරුද්ධ අදහස් ගෞරවනීය ලෙස සමථයකට පත්කර ගැනීමට නොහැකි බවටත් ඇත්ත වශයෙන් මාත් අන් සමහරකුත් අතර වැදගත් මූලික මත ගැටුම් පවතින බවටත් මා නිගමනයට බැස ඇති බව මට කණගාටුවෙන් වුවද කිව යුතුය.

අනාගතයේදී මා මුහුණ දීමට වන දුෂ්කරතාවන් සහ කරදර විශාල බව මම සම්පූර්ණයෙන් අවබෝධ කරගෙන

ඇත්තෙමි. එහෙත් හෘද සාක්ෂිය අනුව මගේ රටේ ජනතාවට මගෙන් ඉටුවිය යුතු යුතුකම ඉටු කරන බවට හැඟීමෙන් මට ඒවාට ඔරොත්තු දීමට පුළුවන. මාත් මාගේ රට වෙනුවෙන් කළයුතු යැයි මා විශ්වාස කරන යුතුකම් කොටසත් අතරට පුද්ගලික අවශ්‍යතාවයන් වැටීමට ඉඩ දුන්නොත්, සේවය සඳහා මා ඇප කැපවී සිටින ජනතාවට එරෙහිව මා අතින් අපරාධයක් වුණා සේ ය.

පුද්ගලිකව අන්තිමට මට ජයග්‍රහණයන් අතින් ලබන්නට දුෂ්කරම ජයග්‍රහණය ලබා ගනිමියි, යන හැඟීමෙන් මෙම සංවේගජනක අවස්ථාවේ මට සැනසීමට පුළුවන." මම මා ජයග්‍රහණය කර ගනිමි."

**- එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්**

## තුන් යුගයක ආවර්ජනයේ - සුවිශේෂ මතක සටහන්

## ප්‍රථම මහජන යුගය

(1) 1955 සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත්කිරීමට බණ්ඩාරනායක මැතිඳුන් විසින් ජාතිය ඉදිරියේ ප්‍රතිඥා දෙනු ලැබීය.

(2) 1956 තීරණාත්මක මහ මැතිවරණයේදී ප්‍රතිවිරුද්ධ නායකයන් වූයේ එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා සහ සර් ජෝන් කොතලාවල මහතාය. බණ්ඩාරනායක මහතාගේ නායකත්වයෙන් වූ මහජන එක්සත් පෙරමුණ එම මැතිවරණයේදී ඉදිරිපත් කළ අපේක්ෂකයන් 60 දෙනාගෙන් 51 දෙනෙක්ම ජයග්‍රහණය කරන ලදී. සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච මහා ජනතා බලවේගයන්හි ප්‍රබල ක්‍රියාකාරිත්වයෙන් බණ්ඩාරනායක මැතිඳුන් විසින් මහජන රජයක් පිහිටුවා ගන්නා ලදී. එක්සත් ජාතික පක්ෂයට හිමි වූයේ අන්ත පරාජයකි. ආසන මට්ටමින් ආසන 8 කි. බණ්ඩාරනායක මහතා වැඩි ඡන්ද 42000 කින් අත්තනගල්ල ආසනය ජයග්‍රහණය කරමින් අග්‍රාමාත්‍ය ධුරයට පත්විය.

(3) 1956-1959 බණ්ඩාරනායක පොදුජන රජයේ තුන් වසරක පාලන කාලය තුලදී ක්‍රියාත්මක කරන ලද පොදු ජන මෙහෙවර අතරින් කීපයක් මෙහි ලා සඳහන් කරමි.

i. සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත්කරන ලදී.
ii. පෞද්ගලික බස් සමාගම් ජනසතු කොට ලංකා ගමනාගමන මණ්ඩලය පිහිටවන ලදී.
iii. කොළඹ වරාය ජනසතු කරන ලදී.
iv. සේවක අර්ථ සාධක අරමුදල පිහිටුවීය.
v. කම්කරු දිනය නිවාඩු දිනයක් ලෙස ප්‍රකාශයට පත් කළේය.
vi. කුඹුරු පනත සම්මත කරන ලදී.
vii. රාජ්‍ය ව්‍යවසාය තුලින් නිෂ්පාදන හා සේවා ආයතන ආරම්භ කරන ලදී.
viii. රට ප්‍රබෝධයට පත් වෙමින් පොදු ජන යුගයක් උදා විය.

ලංකාවේ ජනතාව ලද මේ අසීමිත අයිතිවාසිකම් සම්භාරයෙන් ාහජනතාවට, රටට අසීමිත ප්‍රයෝජනයන් රැසක් සමඟ මානව අයිතීන් ැසක් හිමි විය. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් මේ සියල්ල ජනතාව වෙනුවෙන් ඉටු කරන ලද්දේ ජනතාව කෙරෙහි වූ අපරිමිත මානව ක්තියකින් යුතුවය. මේ අවස්ථාවේදී එතුමන් තමා විසින් තමන්ම ග්‍රහ කළ ආකාරය දක්වෙන වචන පෙළක් මෙහි ලා සඳහන් කරමි.



## ගෞරවනීය නායකත්වය

" දෛවය විසින් මට

ඔබ අතර වැදගත් තැනක්

පනවා දෙනු ලැබ ඇත්නම්

ඒ මා ඔබේ ස්වාමියා

විය යුතු බවට නොව

ඔබගේ සේවකයා විය යුතු බවට ය".

- එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්

ඉහත දැක්වූ පරිදි බණ්ඩාරනායක ශ්‍රීමතාණන් විටින් විට විවිධ ස්ථානයන්හිදී ජාතිය අමතා කරන ලද අගනා ප්‍රකාශයන් එකල්හි බොහෝ දෙනෙකු විසින් පොත් පත් වල ලියා තබා ගත්හ. ඇතැම්හු පසු කලෙක එම ප්‍රකාශ මතු පරපුරේ ප්‍රයෝජනය පිණිස පත්ඉරුවල සඳහන් කළහ. මෙහිදී එම වටිනා අරුත්බර ප්‍රකාශයන්ගෙන් කිහිපයක් දක්වමි.



## ජාතීන් අතර සහජීවනය

"නියම මිත්‍රත්වය හා සහයෝගය පලකල යුත්තේ එකිනෙකා තුල පවත්නා වෙනස්කම් ගැන අන්‍යොන්‍ය අවබෝධයකින් විනා, එබඳු වෙනස්කම් කොහෙත්ම නැතැයි කීමෙන් නොවන බව මගේ විශ්වාසයයි. මෙම කාරණය දෙස බැලිය යුතු නිවැරදි දෘෂ්ටිකෝණය එය බව මගේ අදහසයි.

ලංකාව නිත්‍ය වාසස්ථානයක් වන සියළුම ජන කොටස්වල සාධාරණ හිමිකම් අප අවබෝධ කරගෙන සිටිමු. අප සැමගේ ඉදිරි ගමන සඳහා ජනගහනයේ විවිධ කොටස් අතර මිත්‍රත්වය අත්‍යවශ්‍ය බවද අපි දනිමු."

**- එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්**



# සම සහෝදරත්වය

"අධ්‍යාපනය සම්පූර්ණයෙන් ලබන්න දෙමල ළමයාටත් ඉඩ දෙන්න ඕනෑ නේද? ඒ අයිතිවාසිකම එක තැනකදි කපන්න බෑ නේද? දෙමල ළමයින්ට විශ්ව විද්‍යාලය දක්වාම දෙමල භාෂාවෙන් ඉගෙන ගැනීමට ඉඩදීම සාධාරණයි නේද?

එසේ නුදුන්නහොත් පේරාදෙණියේ විශ්ව විද්‍යාලය වෙනුවට මඩකලපුවේ හෝ යාපනයේ වෙනම විශ්ව විද්‍යාලයක් ඕනෑ කියා දෙමල ජනතාව ඉල්ලීම් කරයි. එහෙම කරන ඉල්ලීමට අපට විරුද්ධ විය හැකිද? දෙමල ළමයින්ට ඔහුගේ භාෂාවෙන් විශ්ව විද්‍යාලීය අධ්‍යාපනය ලබා ගැනීමට ඉඩ දෙන්න ඕනෑ. ඒ නිසා දෙමළ භාෂාවත් විශ්ව විද්‍යාලයේ උගන්වන්නට ඕනෑ".

- එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්
(1958 දී)



# භාෂා සමානාත්මතාව

"සිංහල භාෂාව වැදගත් සාහිත්‍යයක් ඇති ඉතාමත්ම පොහොසත් භාෂාවක් වන්නාක් මෙන්ම මේ රටේ ජනතාවගෙන් සැළකිය යුතු කොටසක භාෂාව වන ද්‍රවිඩ සම්බන්ධයෙන්ද කිව යුත්තේ මෙයම ය. ද්‍රවිඩ භාෂාවේ සාහිත්‍යය ද ඉතා වැදගත් එකකි.

එය කෙසේ වුවද ද්‍රවිඩ භාෂාව නොපිළිගැනීම සිංහලයින් වශයෙන් අප විසින් කරනු ලබන අවැඩක් ලෙස මට පෙනේ."

**- එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්**



# ජාතික සමානත්වය

"අපට බෞද්ධ,
ක්‍රිස්තියානි, ඉස්ලාම් ආදී
ආගම් භේදයන් ගැන සලකා
කථා කිරීමට හෝ ක්‍රියාකිරීමට
වුවමනාවක් නැත.
අපට අවශ්‍ය වන්නේ එකම
ජාති මමත්වයකින් එකම
ජාති හැඟීමකින් එකම
සහෝදරත්වයකින් පොදු දියුණුව
පිණිස ක්‍රියා කිරීම පමණි."

**- එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්**



# හඳුනාගැනීම

"ජේ. ආර්. ජයවර්ධන මහතා
පළමුවෙන් කීවේ
"අපට අපේම සරණ හැර
වෙන සරණක් නැති බව සිතන්න."
යනුවෙනි.
දූන් අර දියේ ගිලෙන්නට යන
මිනිහාට පිදුරු ගහත් රුකුලක් බව
ඔප්පු කරමින්, ඔහුගේ
අවසාන බලාපොරොත්තුව
ලෝක බැංකු වාර්තාව මත
තබා තිබෙනවා'!.

- **බණ්ඩාරනායක මැතිඳුන් 1952 පාර්ලිමේන්තු කතාවකි**



# දේශපාලන සතුරුකම් ඉදිරියේ ධෛර්යයෙන් යුතුව...

"මට විරුද්ධව පෙළ ගැසෙන බලවේග කවරේදැයි මම හොඳින් දනිමි. උඩගුකම, බලය, අයුතු බලපෑම්, මුදල් සහ සමහර විට (මා කියන දේවල්) වැරදි විදියට වාර්තා කිරීම හා විකෘති කිරීම, මේ සියල්ල මට විරුද්ධව යෙදිය හැකි ආයුධ ය. මේවාට එරෙහිව මා සතු ආයුධය නම් මගේ ජනතාවට සේවය කිරීම පිළිබඳව නිහතමානී බව හා අවංකභාවයත්, මේ රටේ මහ ජනතාවගේ විශ්වාසය සහයෝගය ලැබෙතැයි, යටහත්පහත් ලෙස මා බලාපොරොත්තු වන උසස් ප්‍රතිපත්ති සමුදායත්ය."

- එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන



# ශ්‍රී.ල.නි.ප. තුළින් සුභවාදී දේශපාලනයක්...

"මේ අවස්ථාවේදී පැහැදිලි කර දිය යුතුව තිබෙන දෙයක් සුළු වේලාවකදී පැහැදිලි කර දෙන්නට කැමැත්තෙමි. මන්ත්‍රීවරු කීප දෙනෙක් විසින්ම සිංහල මහා සභාව ගැන සඳහන් කර තිබේ. එම නිසා මා අයත් වන එයටත් වඩා මාගේ නායකත්වයෙන් තිබෙන පක්ෂයේ තත්වය හැකි තරම් විස්තර කරදීම අවශ්‍ය යැයි සිතමි.

සමහර මන්ත්‍රීවරුන්ට පුදුමයක් ලෙස පෙනී යා හැකි නමුත් අපේ පරමාර්ථයත්, එක්සත් වීමේ පරමාර්ථයම බව මා සඳහන් කරන්නට කැමතියි. පළමු කොට ජාතියේ එක්සත්කමත් අනතුරුව ලංකාව නිත්‍ය වාසභූමිය ලෙස සලකනු ලබන නොයෙකුත් ජාතීන් අතර එක්සත්කමත් අප බලාපොරොත්තු වන පරමාර්ථයයි.

අපේම මිනිසුන් අතර නොයෙකුත් විදියේ භේද, කුල භේද, උඩරට සහ පහතරට භේද සහ වෙන නොයෙකුත් භේද තිබෙන බව අපි දන්නෙමු. එබැවින් අප සියලු දෙනාගේ ජයකණුව වන එක්සත්කම ළඟා කර ගත යුතු යැයි අපට හැඟී යයි. ඇත්ත වශයෙන්ම ඒ සඳහා හොඳම ක්‍රමය නම් පහළ මට්ටමේ සිට ආරම්භ කිරීමයි. පළමුව සිංහලයින් අතර එක්සත්කම ඇති කළ යුතුයි. දෙවනුව සිංහලයින් එක්සත් කරන අතරම සියලුම ජාතීන් එක්සත් කිරීමට වැඩ කළ යුතුයි.......,

**- එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන**

බණ්ඩාරනායක මහතා එජාපයෙන් ඉවත් වී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය බිහි කිරීම මෙරට දේශපාලන ගමන් මග නව මාවතකට හැරවීමක් විය. අධිරාජ්‍යවාදී ගැති පිළිවෙත් සහමුලින් ඉවත් කර අප රටට ගැලපෙන ප්‍රතිපත්ති සමුදායකින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්ති සැකසිණි. ස්ව ශක්තිය මත රට ගොඩනැගිය යුතුය. යන මතය එතුමා දැඩි ලෙස විශ්වාස කළේය.

නව පක්ෂය පිහිටුවීමේ ඇති වැදගත්කම එතුමා එදා රටට පෙන්නා දුන්නේ මෙසේය.



## නව පක්ෂයට මහජනයාගෙන් ප්‍රසාදය...

"මෙය අපේ රටේ දේශපාලන ඉතිහාසයේ
තරමක් වැදගත්කමකින් යුත් අවස්ථාවකැයි
මම කල්පනා කරමි.
මෙම අවස්ථාව අලුත් දේශපාලන පක්ෂයක එනම්,
ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උපත සටහන් කරන්නාවූ
අවස්ථාවකි.
මේ රටේ සියලුම ප්‍රදේශවලින්
සියලුම ජාතීනට, ආගම්වලට
අයත් මෙතරම් විශාල පිරිසක්
මෙම රැස්වීමට ඇදී එන්නට ඇත්තේ
එකී කරුණු පිළිබඳව අවබෝධය
නිසා බව මට සහතිකය."

**- එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්**

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය



# දුර දක්නා නුවණ

"ඉන්දියානු කම්කරුවන්
150 ක් පමණ දිනපතාම
මණ්ඩපම් කඳවුරෙන් ලංකාවට
පැමිණීමේ තත්ත්වය තව දුරටත්
පැවතුනහොත් අපේ
ලාංකිකයන් ඉඩම් නැති
යාචකයන්ගේ ගණයට
වැටෙනු නියත ය.
කලයුතු පහසු ප්‍රතිකර්මය නම්
ලාංකිකයන්ට හානි පැමිණෙන අයුරින්
පැමිණ සිටින ඉන්දියානුවන්
ස්වකීය ගම්බිම් පෙදෙස් කරා
පිටත් කොට යැවීමයි.
ඒ සමහම කලයුතු තවත්
කාර්යයක් නම් ඉන්දියානුවන්
යෙදී සිටින වතු රැකියාවන්වලට
ලාංකිකයන් පුහුණු කිරීමය."

- එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්



## අද මාධ්‍යකරුවන්ටත් .....

"කිසියම් විරිතක් අනුව වචන කීපයක් යෙදීම කවිය හැටියට බොහෝ අය සලකති. එහෙත් එය ඊට වැඩි පළල් අංග කීපයකින් යුක්ත විය යුතු බව ඔව්හු නොසලකති. උදාහරණයක් කිවහොත්, මලක් දකින සාමාන්‍ය මිනිසාට එහි කිසිම අමුත්තක් නොපෙනේ. එහෙත් කවියෙකුට ඒ දෙයින් අමුතුම ජීවන රසයක් නැගී එය ජීවිතයට සම්බන්ධ කොට දක්වීමට පුළුවනි.

භාෂාවේ ප්‍රවීණත්වය මෙන්ම වචන භාවිතය, විරිත යෙදීම, දාර්ශනිකත්වය කවියෙකු තුළ පවතී.

එහෙත් කාව්‍යකරණය සඳහා විශේෂ උගත්කමක් තිබීම අවශ්‍ය ම යැයි සිතීම නොසුදුසුය. උගත්තු මෙන්ම නූගත්තු ද උසස් කවියෝ වූහ. මිල්ටන් උගතෙකි. ශේක්ස්පියර් උගතෙක් නොවූයේ ය."

**- එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්**



# එදත් එකයි අදත් එකයි..

"ලේක් හවුස් ආයතනයේ නිර්මාතෘ වන නැසීගිය ඩී. ආර්. විජේවර්ධන මහතා පුවත් පත් පටන්ගෙන ඇත්තේ බලයට පත්ව සිටින රජයට එමගින් අනුග්‍රහය දැක්විය යුතුය යන ඉල්ලීමත් සමගය. 1946 දී සුළු කලක් සඳහා මා සභානායක පදවියට පත් වූ අවදියේ "මා අනුගමනය කරන ප්‍රතිපත්ති ගැන මා සමඟ කතා කිරීමට හුළුගල්ල මහතා එවමි" යි විජේවර්ධන මහතා මට කීවේය. හුළුගල්ල මහතා පැමිණ ඩී. ආර්. විජේවර්ධන මහතා තමා අත පණිවුඩයක් එව්වේ යැයි මා හට පැවසීය.

ඔහුට සවන්දීමෙන් අනතුරුව ඔහුට සිගරැට්ටුවක් දුන් මම සුමිතුරු ලීලාවෙන් ඔහුගේ පිටට තට්ටුකොට ඔහු පිටත් කර හැරියෙමි. පසුදා පත්‍රයේ මා මුරුංගා අත්තේ තබා මගේ ගුණ වර්ණනා කොට ලියා තිබූ අයුරු දක්නට ලැබිණ.

එසේ වුවද ඊට පෙර සතියේ ඔවුහු මා උරුලෑවෙකුට උපමා කලහ. උරුලෑවා ගඳගහන සත්වයෙකැයි ඔබ දන්නවා ඇතැයි මම සිතමි. ගිය සතියේදී උරුලෑවෙකු වූ මා සභානායක වූ පසු අති උත්තමයෙකු බවට, ඔවුහු මා පරිවර්තනය කළහ."

**- එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්.**



# අනුරපුර සුරැකුම

"ලෝක පුරාවෘත්තයෙහි අතිශය ප්‍රෞඪත්වයක් දරණ සම් ශුද්ධ නගරයේ එනම් අනුරාධපුරයේ පවිත්‍රතාවත්, පාරිශුද්ධභාවයත් ආරක්ෂා කර ගැනීම සඳහා දැන් පවත්නා තාව ගොඩනැගිලි මහමෙවුනා උයන් පෙදෙසින් ඉවත් කරගැනීමේ ජාතික මෙහෙය මගේ ඇමති අංශයට පැවරී තිබීම ගැන මම ආඩම්බර වෙමි. මෙහි ප්‍රාරම්භක කටයුතු සඳහා දැනටමත් රාජ්‍ය මන්ත්‍රණ සභාව මුදල් වෙන්කොට තිබේ.

සභ්‍ය ගුණ ධර්ම ඇති කිසිම පුද්ගලයෙකු මේ ප්‍රයත්නයට විරුද්ධ නොවන නමුත් එක් පුද්ගලයෙක් පමණක් ඊට විරුද්ධව සතුරුව සිටී. මොහු නම් අපේ ශුද්ධ නගරයට ආසන්න ගම්වල දුප්පත් අසරණ සහෝදර සහෝදරියන් හිඟන්නන් ලෙස තබා ගනිමින් ඔවුන්ගෙන් හැමදාම දෙවියෙකු මෙන් සැලකුම් ලබන්නට බලාපොරොත්තු වන නිවටයෙකු වූ ශ්‍රීමත් ය..

සිංහලයන්ගේම වරදින් මන්ත්‍රණ සභාවට පත් වී හැම අවස්ථාවකදීම සිංහලයන්ටම හතුරුකම් කිරීමේ දුෂ්ඨ චේතනාව ඇති මේ නාකි මනුෂ්‍යයා අනුරාධපුරයේ පරිශුද්ධභාවය ආරක්ෂා

කර ගැනීමේ උදාර ප්‍රයත්නයට කදින්ම විරුද්ධ ව ක්‍රියා කරයි.

අවාසනාවකට මෙන් මොහු මට අනුරාධපුරයේදී මුණ නොගැසෙයි. ස්වකීය සගයන් මෙන්ම මොහුද පරාජය දුටු තැන දක්ෂ ලෙස පසු බසින්නේය. ඔහුට එකක් කියන්නට මම කැමැත්තෙමි. මේ පරම පාරිශුද්ධ අනුරාධපුර ශුද්ධ නගරය තුල ඔහුට කැමති පරිදි නාඩගම් නටන්නට ඉඩ නොතබමි".

- එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන්




# සත්‍යය දැක්ම

"මිනිසෙකු වශයෙන් ක්‍රිස්තුස් වහන්සේට ප්‍රේම කිරීමට මට හැකි විය. එහෙත් දෙවියෙකු පිළිගැනීමට හෝ දෙවියන්ට යටත් වීමට කොහෙත්ම පිළිවන්කමක් නැති බව මට සිතේ. මේ මා තුල වූ උභතෝකෝටික ප්‍රශ්නයයි.

මේ තත්ත්වය යටතේ මම පල්ලි යාම ආත්ම වංචාවක් බැවින් මම පල්ලි යාම නැවතීමි.

දෙවියන් පිළිබඳ අදහස විෂය මූල නොවන බව මම ඊත්තු ගතිමි. ඒ වනාහි මිනිසා දෙවියෙකු මැවූ බව හා දෙවියා විසින් මිනිසෙකු නොමැවූ බවය."

- එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන



# දරු සෙනෙහස

පියෙකු විසින් තම ආදරණීය පුතුගේ සමරු පොතේ වැකියක් ලියන ලදී. එය ලියූ එම වැකිය තුල රටකට සමස්ත සමාජයටම ඉතා ශ්‍රේෂ්ඨ ආදර්ශයක් විය.

වැකිය : "මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීමයි"

ලියුවේ : එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමන් විසින් තම පුත් අනුර බණ්ඩාරනායකයන්ගේ සමරු පොතේ පිටුවක ය.

දිනය : 1959 ජනවාරි 06 දා ය.

# මනුෂ්‍යත්වය ඝාතනය කිරීම. ප්‍රථම පොදුජන යුගයේ නිමාව

බණ්ඩාරනායක මැතිඳුන්ගේ ප්‍රගතිශීලී ජනතාවාදී රාජ්‍ය තන්ත්‍රය විසින් දේශයේ සම්පත් ජාවාරම්කරුවන්ට පාවා නොදීමේ වෛරය ප්‍රධාන කොට ගත් නවත් පරමාර්ථ ඇතිව ජාවාරම්කාර ප්‍රතිගාමීන් සාකච්ඡාවක් පැවැත්විය.

අනතුරුව තීරණයක් ගත්හ. ඒ සඳහා ඔවුන් පුද්ගලයෙකු සූදානම් කලහ.

1959 සැප්තැම්බර් 25 වෙනිදා ගරු අග්‍රාමාත්‍ය එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා වෙඩි තබා ඝාතනය කරන ලදී. රොස්මිඩ් පෙදෙසේ නිවසට පැමිණි බෞද්ධ වෙස් ගත් පුද්ගලයකු විසින් මේ මහා ඛේදවාචකය සිදු කරන ලදී. ආසියාවේ රත්දිව යැයි ලොවින් පිදුම් ලද මේ මහා යුග පුරුෂයා නිහඬ කරන්නට අප රටේ එවකට සිටි ප්‍රතිගාමී බලවේග ක්‍රියා කරන ලදී.

නිරන්තරයෙන් විවෘත හදවතක් හිමි දේශයේ සදාදර නායකයා සිය අගමැති නිවසේ ගේට්ටුව ජනතාව වෙනුවෙන් විවෘත කර තබන්නට තරම් කරුණාවන්ත විය. ඒ කරුණාවන්තකමින් සතුරාගේ අභිප්‍රාය ජය ගති.

අපේ රටේ පුංචි මිනිසුන්ගේ ලොකු බලාපොරොත්තු සුනුවිසුණු විය. පොදු ජන අරගලයේ ධජය බිම වැටිණ. තම රටට පමණක් නොව මුළු ආසියාවටම අසහාය උදාරතර සේවයක් ඉටු කළ මේ උදාර නායකයා පසු දින එනම් 1959 සැප්තැම්බර් 26 වන දින දෙනෙත් පියා ගත්තේය.

එදින අප්‍රාණික වූයේ බණ්ඩාරනායක ශ්‍රීමතාණන් පමණක් නොවේ. සමස්ත ජාතියම ය. දේශයත් ජාතියත් අගතියෙන් බේරා අනන්ත වූ ජාතික අපේක්ෂාවන් ඉදිරියේ ජාතියේ අනාගතයේ කවුළු විවර කොට නිහඬව නික්ම ගියේය.

එහෙත් එතුමන්ගේ දැවැන්ත වූ පොදු ජන මෙහෙවරහි පිය සටහන් නොමැකෙන පරිදි ඉතිරි විය.

පොදු ජනතාව මහ හඬින් හැඬූහ
පොදු ජනතාවගේ වෛරක්කාරයෝ අස්වැසුණාහ. සුදු අධිරාජ්‍යවාදීන්ගේ තෝන් ලණුව අල්ලාගෙන සිටි ජාවාරම්කාර පැලැන්තිය අගමැතිවරයාගේ නිසල දේහය දෙසට ගලන මහා ජන ගංගාව දෙස වෛරයෙන් බලා සිටියහ. ප්‍රජාතන්ත්‍රවාදී අරගලයේ නිර්මාතෘ දිවංගත අගමැති ගරු එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මැතිඳුන්ගේ දේහය වටා රොක් වූ තරම් අති දැවැන්ත ජන ගංගාවක් මා කිසිදාක දැක නැත.

මලානිකව ගිය මලේ සුවඳ දැන්
දැනේ තියුණු ලෙසිනේ.....

මේ මහා ජන ගංගාව සිය නායකයාගේ අධිරාජ්‍ය විරෝධී සටනේ ධජය ඝාතනයෙන් පසු බිම දමන්නට සූදානම් නොවූහ. සමස්ත ලාංකිය මහ ජනතාවගේ එකම අපේක්ෂාව වූයේ සිය නායකයාගේ ප්‍රතිපත්ති සහ අධිරාජ්‍ය විරෝධී අරගලය නිර්භයව ඉදිරියට ගෙන යාමට ශක්තිමත් ඊළඟ නායකත්වය තීරණය කිරීමයි.

"ගඟක් ගලන්නේ ඉස්සරහටයි
පස්සට ගලන සිරිතක් නෑ" .....




ජාතියේ මාතාව, ලොව ප්‍රථම අගමැතිනිය

දිවංගත අග්‍රාමාත්‍ය ගරු

**සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය**

# අභීත නායකත්වය



ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය

## දෙවන මහජන යුගය ගැන මගේ මතකය..

හදිසියේ වූ රුදුරු බේදවාචකයෙන් රට ගොඩ ගන්නට ත
එම වේදනාව මැද්දේම දේශයේ අතරමං වුනු ජනතාව අතරට
යුතුය, තම දයාබර ස්වාමිපුරුෂයා වූ දේශයේ මහා දේශපාලනඥ
ගොඩ නැගූ පක්ෂය සහ එතුමාගේ ප්‍රතිපත්ති ගිලිහී යාමට ඉ
නොදෙමියි ජනතාව වෙනුවෙන් එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
පමණක් යන්නෙමියි යන අදහස ගරු සිරිමාවෝ බණ්ඩාරනාය
මැතිනිය තීරණය කළාය. දරුණු ප්‍රතිගාමීත්වයක් හමුවේ බණ්ඩාරනාය
මැතිනිය එ.ජා.ප. විරෝධී සියළු බලවේග එක්රැස් කළාය. මේ දුෂ්ක
කටයුතු කර ගන්නට ශක්තිය වූයේ ප්‍රගතිශීලී ජනතා බලවේගය
1960 දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණිය ශ්‍රී ලංකා නිදහස් පක්ෂ
වේදිකාවට පිවිසී ජනතාව ඇමතුවාය.

මහජන එක්සත් පෙරමුණේ නායකත්වයට පිලිප් ගුණවර්ධ
මහතා පත්විය.

1960 මැයි 07 දා ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණි
ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයට පත්විය. අවුල් වියවුල් පැනනැ
තිබූ පක්ෂ ක්‍රියාකාරිත්වය ඉතා ප්‍රබෝධයකට පත් කරමින් පක්ෂ
පණගැන්වීමේ කටයුතු ආරම්භ කළාය. ගරු මැතිනිය පක්ෂ
සභාපතිත්වයට පත්වීමෙන් ජනතාව තුළ හොඳ ප්‍රබෝධයක් ඇති විය
මැතිනියගේ නායකත්වයෙන් පන්නරය ලැබූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ
යලිත් ප්‍රතිගාමීත්වයට එරෙහිව ශක්තිමත් විය.

1960 ජූලි මහ මැතිවරණයේ ජනතා තීන්දුව වූයෙ
බණ්ඩාරනායක ශ්‍රීමතාණන්ගේ ජනතා සුබවාදී දේශපාලනය මහා
ඉහළින් අනුමත කිරීමයි. එනම් මැතිවරණ ඉතිහාසයේ වාර්තාව
තබමින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 75 ක් ජය ගනිමින් මහජ
රජයක් පිහිටවන ලදී. ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ශ්‍රී
ලංකා අග්‍රාමාත්‍යතුමිය ලෙස දිවුරුම් දුන්නාය. එදා ඒ දිවුරුම් දෙ
ලැබුවේ ලොව ප්‍රථම අගමැතිනියයි. එතැන් පටන් අපේ රටට අස

සම දේශපාලන නායකත්වයකුත් දේශීය වූ නව ආර්ථික හැඩතලයකුත් අපේ මාතෘ භූමියේ නිදහස, ස්වාධීනත්වය, ස්වෛරීභාවය සඳහා වූ විවිධ වැඩ පිළිවෙල රැසකුත් නිර්මාණය වන්නට විය.

ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ප්‍රථම රාජ්‍ය කාලයේ

i තෙල් ව්‍යාපාරය ජනසතු කිරීම.

ii මහජන බැංකුව පිහිටුවීම.

iii ලංකා බැංකුව ජනසතු කිරීම

iv. කෝටි 4 ක වියදමින් වේයන්ගොඩ පෙහෙකම්හල ආරම්භ කිරීම.

v. කාර්මික ජනපද පිහිටුවීම.

vi. සිරිමා - ශාස්ත්‍රි ගිවිසුම අත්සන් කොට රටක් නැති ඉන්දියානුවන් පිළිබඳ ගැටළුව විසඳීම.

vii. පුවත්පත් මණ්ඩලය පිහිටුවීම.

viii. රක්ෂණ සමාගම් ජනසතු කිරීම.

ix. ජාතික අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම.

x. පෞද්ගලික පාසල් රජයට පවරාගෙන රජයේ පාසල් බවට පත් කිරීම

මේ ආදී ඉතා වැදගත් ජනතාවාදී පියවර රැසක් මැතිනියගේ ප්‍රථම රජය යටතේ ගන්නා ලදී. ජාතික අපේක්ෂාවන්ට පණ දෙමින් රක්ෂණ ව්‍යාපාරය ජනසතු ව්‍යාපාරයක් වූයේය. ආර්ථික, සංස්කෘතික ක්ෂේත්‍රයේ අසමාන ජයග්‍රහණ ලැබෙනු පෙණින.

මේ අවස්ථාවේදී ද ජනතා විරෝධී ප්‍රතිගාමී කොටස් සිය වෛරය ජාතියේ නායිකාව වෙත එල්ල කළහ. ගරු මැතිනියට සතුරන් විසින් රජය පෙරළා දැමීමේ කුමන්ත්‍රණයක් සූදානම් කළහ.

ඒ කුමන්ත්‍රණය වූයේ 1964 දෙසැම්බර් 03 දා රාජාසන කතාවට ඡන්දය විමසීමේදී ආණ්ඩුවේම සිටි ඇමතිවරුන් කිහිප දෙනෙකු රජයට විරුද්ධව ඡන්දය දීමයි. මේ රජයට විරුද්ධව ඡන්දය දුන් පිරිස 14 දෙනෙකු බව කියැවේ. ඔවුහු පත්තර සමාගම් අයිතිකරුවන් සැපයූ අල්ලස් රැගෙන මේ ආකාරයට රජය පැරදවූ බවට ආරංචි විය.

එම කුමන්ත්‍රණයෙන් ගරු මැතිතියගේ මහජන රජය විසුරුවා හැරීමට සිදු විය.


# යළි උපන් 56 පොදුජන යුගය
## 1970 මැයි මහ මැතිවරණයෙන් විශිෂ්ට ජයක්....

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන 106 කට තරග වැදුණි. සම සමාජ පක්ෂය ආසන 23 කට ද ලංකා කොමියුනිස්ට් පක්ෂය ආසන 9 කට පක්ෂ තුනේ සන්ධානය වූ සමගි පෙරමුණ යටතේ තරග වැදුනි. එක්සත් ජාතික පක්ෂය හත් හවුලක් ලෙස සන්ධානගත වී ආසන 128 කට තරග වැදුනි.

1970 මැයි 27 දින සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ප්‍රමුඛ සමගි පෙරමුණ අති විශාල ජන වරමක් ලබමින් මැතිවරණ ඉතිහාසයේ වැඩිම ආසන සංඛ්‍යාවක් හිමිකර ගනිමින් විශිෂ්ඨ ජයග්‍රහණයක් ලැබීය.

| | |
|---|---|
| ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ආසන | 90 |
| සම සමාජ පක්ෂය ආසන | 19 |
| ලංකා කොමියුනිස්ට් පක්ෂය ආසන | 06 |

එක්සත් ජාතික පක්ෂයට ලබාගත හැකි වූ මුළු ආසන සංඛ්‍යාව 17 කි. පරාජය වූ ආසන ගණන 111 කි. හත් හවුල් එජාපය එදා බරපතල පරාජයක් ලැබූ අයුරු මට අද වාගේ මතකය.



ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය 1970 මැයි 29 දා දෙවන වරටත් ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරිය වශයෙන් දිවුරුම් දුන්නාය.

යළි උපන් 56 නව යුගයේ ජනතා අපේක්ෂාවන් ඉටු කිරීමේ කාර්යභාරය සමගි පෙරමුණු රජය විසින් භාර ගන්නා ලදී. මෙවර බලයට පත්වූයේ ජාතික අරගලයේ පොදු නායකත්වය ගත් බණ්ඩාරනායක මැතිනියත් සමසමාජ හා කොමියුනිස්ට් පක්ෂ වල අධිරාජ්‍ය විරෝධී සටහන එකතු වූ කණ්ඩායමක් නිසා ජනතාවට වඩාත් ප්‍රයෝජනයක් සැලසිණ.



ශ්‍රී ලංකාව නිදහස් නිවහල් රාජ්‍යයක් බවට පත් කිරීමේ අරමුණින් ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා ජාතික රාජ්‍ය සභාවේ තුනෙන් දෙකක බලයක් ලබා ගැනීමට මැතිනියට හැකියාව බලය ලැබිණ.

1970 ජනතා ජයග්‍රහණය නිසා ලංකාව නිදහස් ස්වාධීන ස්වෛරී ජන රජයක් බවට පත් කිරීමට ගරු මැතිණියට හැකි විය.

1. එක් පුද්ගලයෙකු සතු විය හැකි ඉඩම් ප්‍රමාණය අක්කර 50 ක් ලෙස සීමා කොට ඉඩම් ප්‍රතිසංස්කරණ පනත ඉදිරිපත් කරමින් බ්‍රිතාන්‍යයට අයත් රන් පවුම් වතු සමාගම් අහෝසි කිරීමට මැතිනිය ක්‍රියා කරන ලදී. මේ අනුව බණ්ඩාරනායක පවුල සතු වූ ඉඩම්ද අක්කර දහස් ගණනක් ජනතා සන්තක විය.

2. ජනතාවට හාල් සේරු 2 ක සලාකයක් ලබාදීම.

පාසල් දරුවනට දිවා ආහාරය සැපයීම.

මහවැලි ගඟ උතුරට හරවා රට ගොවිතැනින් ස්වයංපෝෂණය කිරීමේ මහා වාරි යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

දේශීය රෙදි නිෂ්පාදනය වැඩි දියුණු කරමින් තුල්හිරිය, මින්නේරිය, වේයන්ගොඩ, පූගොඩ පෙහෙකම්හල් ඉදිකිරීම.

මැණික් සංස්ථාව පිහිටුවා මැණික් කර්මාන්තය ශ්‍රී ලංකාවේ ප්‍රධාන විදේශ විනිමය මං පෙතක් ලෙස සංවර්ධනය කිරීම.

රජයේ චිත්‍රපට සංස්ථාව පිහිටුවා දේශීය සිනමාව ඔප් නැංවීම හා කලාකරුවන්ට අතහිත දීම.

3. කච්චතිවු දූපත ඉන්දියාව සමඟ සාකච්ඡා මාර්ගයෙන් ශ්‍රී ලංකාවට අයත් කර ගැනීම.

පෝක් සමුද්‍ර සන්ධියේ අයිතිය දෙරට විසින් සාධාරණව බෙදා ගැනීම.

මුවුබිමට අයත් වෙරළ තීරුව සැතපුම් 200 දක්වා වැඩි කිරීම.

4. රතුළූණු, වියලි මිරිස්, මුං, කව්පි, සහල් ආදියෙන් ලංකාව ස්වයංපෝෂිත මට්ටමට පත් කිරීම, එම ද්‍රව්‍ය පිටරටින් ගෙන්වීම නැවැත්වීම.

5. අල්ලස් කොමිසම නීතිගත කොට අල්ලස, දූෂණය රාජ්‍ය තන්ත්‍රයෙන් පලවා හැරීමට කටයුතු කිරීම. අල්ලස් කරුවන්ට සිර දඬුවම් දීම.

6. කුලී නිවැසියන්ට එම පදිංචි නිවෙස් අයත් කරදීම.

7. ජනතා කමිටු පිහිටුවා, ජනතාවගේ අයිතිවාසිකම් රැකීම සඳහා ගම් බිම් මට්ටමින් කටයුතු කිරීම.

8. සමූපකාර ව්‍යාපාරය ඉතාම දියුණු තත්වයකට පත්කොට ග්‍රාමීය ආර්ථිකයේ ප්‍රධාන මධ්‍යස්ථානයක් කිරීම.

9. චිත්‍රපට ඒකාධිකාරය, පුවත්පත් ඒකාධිකාරය අහෝසි කොට අයිතිය පුළුල් කොට ජනතාවාදී සේවා බවට පත් කිරීම.

10. නැව් සංස්ථාව පිහිටුවීම.

ලංකා රාණි, ලංකා සාගරිකා, ලංකාදේවි, ලංකා කල්‍යාණි, ලංකා කාන්ති, ලංකා ශාන්ති, ලංකා කීර්ති, ලංකා රත්න හා තම්මැන්නා යන නෞකා මිලයට ගැනීම. (නැව් සංස්ථාව 1974 වන විට රුපියල් කෝටි 350 ක් රජයේ ආදායමට සපයා දී තිබුණි.)

11. ටයර් කර්මාන්තය, සිමෙන්ති කර්මාන්තය, පිහන් කර්මාන්තය, වානේ කර්මාන්තය, කඩදාසි, ලුණු, සීනි, සම්භාණ්ඩ මේ සියළු කර්මාන්ත සංස්ථා ලෙස බිහිකොට ලක්ෂ සංඛ්‍යාත පිරිසකට රැකියා උදාකලේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ සමගි පෙරමුණු රජයයි. මේ සෑම සංස්ථාවක්ම හොඳ කාර්යක්ෂමතාවයකින් යුතුව ලාභ ලබන තත්වයෙන් පවත්වා ගෙන යන ලදී.

12. රටවල් 86 කින් සමන්විත වූ මෙම සමුළුව ලංකාව ජාත්‍යන්තරයේ සුවිශේෂ ස්ථානයක් කරා රැගෙන ගියේය.

මෙහි සභාපති පදවියට පත් වී අන්තර් ජාතික ප්‍රශ්න රැසක් සාකච්ඡාවට ගැනිම, එම ප්‍රශ්න නිරාකරණය කර ගැනීමට උපකාරී වීම, එම ප්‍රශ්න නිරාකරණය කිරීම නිසා මැතිනියට ජාත්‍යන්තර කීර්තියට පත් වූවා ය. මැද පෙරදිග රැකියා දොරටු ශ්‍රී ලාංකිකයන්ට විවර වූයේ මේ කාලයේදී ය.

13. වගා සංග්‍රාමය ආරම්භ කොට ශ්‍රී ලංකාවේ සෑම කෘෂි බිම් අඟලක් තුලම ආහාර භෝග වගාව ව්‍යාප්ත කිරීමට මැතිනිය කටයුතු යෙදුවාය. පාන් පිටි භාවිතය අඩු කොට දේශීය ආහාර පාන පාරිභෝජනයට ජනතාව පෙළඹවීමේ කටයුතු ඇරඹුයේ රටේම ජනතාවගේ යහපතටය.

14. අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාව පිහිටුවීම හා විදේශ විනිමය වංචා කොමිසම පිහිටුවීමද මැතිනියගේ රජයේ ජනතා අභිවෘද්ධි මෙහෙවරකි.

15. 1971 කැරැල්ලට සම්බන්ධ වූ දස දහස් සංඛ්‍යාත තරුණ තරුණියන් පුනරුත්ථාපනය කොට ඔවුන් යහමගට යොමු කිරීම, වැරදි වලට හසු වූවන් බන්ධනාගාර ගත කිරීම, විනිමය වංචාවලට හසුවූ කෝටිපති ව්‍යාපාරිකයන් රැසක් බන්ධනාගාර ගත කිරීම ගරු මැතිනියගේ සමගි පෙරමුණු රජයේ එඩිතර තීරණයන් විය.

මෙබඳු මතකයේ රැඳුණු සුවිශේෂ ජන මෙහෙවරයන්ට වඩා ඔමතකයෙන් ඇත් වූද පොදු ජන අභිවෘද්ධියම කැඳවූ විශිෂ්ඨ සේවා ර. ඝසක් මැතිනියගේ සමගි පෙරමුණු රජයෙන් ඉටු වූවා මට මතකය.

# 1977 - 1993 ලාංකීය දේශපාලනයේ අවිචාරවත් වියරු යුගය..

1980 දශකය වන විට ලංකාවේ බලයට පත්ව තිබුණේ ජේ.ආර්.ජයවර්ධන රජයයි. 1977 දී බලයට පත් වූ ජේ.ආර්. 1982 දී මහ මැතිවරණයක් පැවැත්විය යුතුව තිබුණත් ජනමත විචාරණයක් පවත්වා තම රාජ්‍ය කාලය වසර 6 කින් දීර්ග කර ගත්තේය. එම ජනමත විචාරණය "කලගෙඩි-ලාම්පු කොල්ලය" නමින් ප්‍රකට වූයේ ඉතාම වංචනිකව පැවති ඡන්ද විමසීමක් වූ බැවිනි. ඉන්පසු නැවත උදාවූ වසර 6 ක් වූ ජේ.ආර්. රාජ්‍ය සමය ශ්‍රී ලංකාවේ ජන සමාජයට අභාග්‍ය යුගයක් විය.

එ.ජා.ප. රජයේ පාලන කාලය වසර 6 කින් දිගු කරගෙන වසරක් යාමට පෙර ජාතිවාදී කෝලාහල ඇතිවන්නට පටන් ගති. 1983 දී කළු ජූලිය නමින් හැඳින්වූ ජාතිවාදී කලබල වලින් ද්‍රවිඩ ජනයාගේ නිවෙස්, දේපල, සහ ජීවිත රැසක් අහිමි විය. ගිනිතැබීම්, ඝාතන, මංකොල්ල කෑම්, ස්ත්‍රී දූෂණ ආදී තුච්ච ක්‍රියාකාරකම් දිවයිනේ ප්‍රදේශ රැසකම සිදුවිය. බෙහෝ ද්‍රවිඩ පවුල් කොළඹ සහ පිට පළාත් අතහැර ආපසු යාපනයටම හෝ පිටරටවලට පවා යන්නට ගියහ. එම වියරු ප්‍රචණ්ඩත්වය රටපුරාම පැවතිණ. යුද්ධයට පසුබිම් වූ ජාතිවාදී ගිණිපුපුරු ඇවිලිගියේ මේ කාලයේදීය. මේ කාලය රට දේශපාලනයෙන් ජාතිවාදී යුද්ධය කරා තල්ලු වූ යුගය ලෙස හැඳින්විය හැකිය.

1987 වන විට රටේ අපරාධ ප්‍රමාණය සීග්‍රයෙන් වැඩි වන්නට විය. ජාතිවාදී කලබලයේ ප්‍රතිඵල ලෙස දිවයිනේ බොහෝ ප්‍රදේශවල බෝම්බ පිපිරවීම්, වෙඩිතැබීම් සිදුවිය. දිනපතාම සිය ගණනක් ජනතාව බෝම්බවලට බිලිවූහ. මේ බෝම්බ පිපිරීම්වලින් වැඩිපුර මියගියේ ඉතාම අහිංසක මිනිසුන්ය. කොළඹ තැන් තැන්වල පුපුරුවා හැරී බෝම්බවලින් දහස් ගණන් ජනතාව මියගිය අතර ගොඩනැගිලි සුන්බුන් බවට පත් විය. ප්‍රසිද්ධ ස්ථානවල මිනිසුන් ගැවසීමට පවා බිය වූ කාල පරිච්ඡේදයක් උදාවිය. එල්.ටී.ටී.ය විසින් පුපුරුවා හරින ලද බෝම්බ වලින් මියගිය අය අතර විවිධ තරාතිරමේ අය වූහ. ගැහැණු

මිනිස්සු, ළමයින්, ළදරුවන්, ගැබිණි මව්වරුන්, භික්ෂූන්වහන්සේලා සහ කතෝලික මුස්ලිම් පූජකවරුද වූහ.

අරන්තලාවේදී භික්ෂූන් වහන්සේලා 40 ක් පමණ එක තැනම ඝාතනය කරන ලදී. මඩකලපුව, අම්පාර, යාපනය ආදී ප්‍රදේශ වල පොලීසිය හමුදාව සහ වෙනත් ආරක්ෂක අංශවල සේවය කළ දහස් ගණන් සොල්දාදුවෝ ඝාතනය කරන ලදී. යුද්ධය වඩාත් දරුණු අතර හැරිණ. යුද්ධය වෙනුවෙන් සාමය පලවා හැර ජාතිවාදය වර්ධනය විය.

යුද්ධය තුල එ.ජා.ප. රජය විසින් රාජ්‍ය දේපල මහා පරිමාණ අන්දමින් විකුණා කෑහ. එ.ජා.ප. බලවතුන් හට රටේ ආර්ථිකයේ දේපල තුට්ටු දෙකට අවිචාරශීලිව අලෙවි කර කෝටි ගණන් ඉපැයීමට ධනයෝග පෑදී තිබිණ.

1988 වන විට රාජ්‍ය භීෂණය තදින් පැතිර ගියේය. යුද්ධයත් රාජ්‍ය භීෂණය තුල මිනිසුන් ආදෝනා නගන්නට විය. ද්‍රවිඩ ජාතිවාදීන් මිනිසුන් බුරුතු පිටින් මහ මග ඝාතනය කරද්දී එ.ජා.ප. රාජ්‍ය භීෂණයෙන් ප්‍රගතිශීලී මිනිසුන් ඝාතනය කිරීම උග්‍ර අතර හරවා තිබිණ.

භීෂණයේ තොරතුරු ලියන්නේ නම් පිටු දෙක තුනක් නොව තවත් පිටු දහස් ගණනක් ලිවිය යුතු වේ.

1989 න් පසු තත්වය තවත් උග්‍ර අතට හැරිණ. 1989 දී ජේ.ආර්. ජනාධිපතිධුරයෙන් විශ්‍රාම ගත් පසු ප්‍රසිද්ධියේම වංචනිකව පැවැත්වූ ජනාධිපතිවරණයෙන් ආර්. ප්‍රේමදාස මහතා බලයට පත්විය. ප්‍රේමදාස කරගෙන යමින් තිබූ වැඩ කොටස් ඒ අයුරින්ම කරගෙන ගියේය. රාජ්‍ය ත්‍රස්තවාදය තව තවත් වඩාත් උග්‍ර අතර හැරිණි.

තරුණයන් බුරුතු පිටින් මහමග දවෙන්නට විය. ටයර් සෑය දිවයිනේ සෑම ගමකම දක්නට ලදී. අමු අමුවේ ටයර් මත දවෙන තරුණ ජීවිත ඉදිරියේ ජාතියම හඩා වැටෙන්නට විය. උමතු රාජ්‍ය පාලනය විසින්

කිසිම රාජ්‍ය සමයකට සමකල නොහැකි තරම් මට්ටමකට රා:
භීෂණය, ත්‍රස්තවාදය උත්සන්න විය.

ප්‍රේමකීර්ති ද අල්විස්, තේවිස් ගුරුගේ, විජය කුමාරතුංග, ලලි
ඇතුලත්මුදලි ඇතුළු සම්භාව්‍ය කලාකරුවන් සහ දේශපාලනඥයන්
සක්ද ජාතියට අහිමි කරන්නට ප්‍රේමදාස පාලනය ක්‍රියාකරන ල
ජ.වි.පෙ. නායක රෝහණ විජේවීර අමු අමුවේ ඝාතනය කරන ල
ජාතියට අහිමි වූ තරුණ ජීවිත ප්‍රමාණය ලක්ෂ ගණනක් විය.

කුරිරු යුද්ධය ද ලියලා තිබිණ. රාජ්‍ය දේපල සහ මිනිස් ඝාත
දරුණු ලෙස විනාශ වෙමින් තිබිණ වියරු එල්.ටී.ටී යට ප්‍රේමදා
රජය විසින්ම අවි ආයුධ ද සපයන ලදි. අවි සැපයීම කුම
චේතනාවකින් සිදු වුවද එම අවි ආයුධ දේශයට එරෙහි කුරි
යුද්ධයට යොදා ගැනීමෙන් තව තවත් අහිංසක මිනිස් ජීවිත දස දහ
ගණනක් විනාශ විය.

මේ අවිචාරවත් අඳුරු යුගයේදී සමස්ත ලංකීය සමාජය ම බිඳ වැටෙමි
තිබිණ. ජනතාවට පක්ෂ භේදයකින් තොරව ජාතික නායකත්වය
අවශ්‍යතාවය මහත් සේ දැනෙන්නට විය. ජනතාවට අවශ්‍ය ව තිබුණේ
පක්ෂ දේශපාලනයක් නොව දේශය ගොඩනගා ජනතාව සුරකි
ජාතික නායකත්වයකි.

එහෙත් වියරු ප්‍රචණ්ඩකාරී රාජ්‍ය පාලනය ඉදිරියේ කවර ජ
නායකත්වයක් බිහිවේද?

මේ වන විට ප්‍රගතිශීලී දේශපාලනයට දුටු තැන වෙඩිතබා මිනිස
ගොඩගසා ප්‍රජාතන්ත්‍රවාදය පළවා හැර මිනිසුන් ඝාතනය කරමි
සිටියහ. ජ.වි.පෙ. තරුණ තරුණියන්ට ප්‍රසිද්ධියේ ම උන්හිටි තැන
මරණය තීන්දු වී තිබිණ. එමෙන්ම ජනතාවාදී දේශපාලනයේ නිර
ඕනෑම පුද්ගලයෙකුගේ මරණය පෙති පෙති තිබිණ. මරණය කැඳ
තිබිණ.

එපමණකුදු නොවේ. එකට හිඳ දේශපාලනය කල එකම පක්ෂයේ මිතුරන්ද ඝාතනය වන්නට පටන් ගති. රන්ජන් විජේරත්න වැනි පුද්ගලයන්ද ඔවුන් අතින්ම ඝාතනය විය.

අභිමි වූ දේශපාලනඥයන් අතර ලලිත් ඇතුලත්මුදලි මහතාද වෙයි. ඩෙන්සිල් කොබ්බෑකඩුව මහතා වැනි උතුම් ලංකා යුද සෙන්පතියන්ද ජාතියෙන් තුරන් කරන ලදී.

සමස්ත ලාංකීය ජන සමාජයම මරණය ඉදිරියේ අසරණ විය. යුද්ධයත්, රාජ්‍ය ත්‍රස්තවාදයත් එකමුතුව නිර්මාණය කරන ලද භීෂණය සමස්ත ජාතියටම, දේශයටම මහත් වූ ඛේදවාචකයක්ම විය.

සූරියකන්ද, අඹිලිපිටිය සහ දිවයිනේ සෑම තැනම මිනිකඳු ගොඩගැසිණ. සමූහ මිනිවල් ඉදිකොට තිබිණ. ජාතියම දේශයම කඳුළු ධාරාවක්ම විය.

1993 වන විට ලාංකීය දේශපාලනයෙහි සුවිශේෂී වෙනස්කම් රැසක් සිදුවිය යුතු කාලය එළැඹ තිබුණි.

අපේ දේශයට ජනතාවට නව දේශපාලන නායකත්වයක අවශ්‍යතාවය තදින්ම මතු වී තිබිණ. ප්‍රගතිශීලී ජනතාවාදී දේශපාලන නායකත්වයක් තුළින් රට ජාතිය සහ ආගම බේරාගැනීමේ ජාතික අවශ්‍යතාවය දැඩි පැන නැගුණි.

ශ්‍රී ලංකාවේ තෙවන මහජන යුගය වූ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ශ්‍රී ලංකා දේශපාලනය අභිමුඛව සිටි මෙහොතේ රටේ පැවති තත්වය එසේ විය.

තමන් සිටින්නේ කුරිරු භීෂණය විසින් තීන්දු කරන ලද මරණය අභියස වුවත් ශ්‍රී ලාංකීය සහෝදර ජනතාව අතහැර යාම ශ්‍රේෂ්ඨ දෙමව්පියන්ට කරන අගෞරවයක් බව එතුමියගේ දැඩි විශ්වාසය විය.

# තෙවන මහජන යුගය

දේශයේ ප්‍රතාපවත් නායකයන් වූ අග්‍රාමාත්‍යවරුන් දෙදෙනෙ
සුජාතව ඉපිද ස්වකීය මවගේ රාජ්‍ය පාලන කාලයේදී සිය පවුල
අයත් ඉඩම් අක්කර දහස් ගණනක් ජනතාව අතර බෙදා දීමට පුරෝගා
වූ ජනතා දියණියක වූවාය.

දෛවයේ තීරණය පරිදි දේශයේ ජනතාවගේ ප්‍රාර්ථනාය පරි
ඇය අපේ දේශයේ ජන කිරුළ පළඳින්නට වාසනාවන්ත වූවාය.

ඇය දේශයට මහගු දායාදයක් වූ බණ්ඩාරනායක චින්තන
නිර්ව්‍යාජ ප්‍රතිරූපයයි. එමෙන්ම ඇය චනාහි ශ්‍රී ලංකාවේ මහා ජ
ගංගාවේ තෙවැනි යුගයයි. ඇය වූ කලී ශ්‍රී ප්‍රජාතන්ත්‍රවාදී සමාජවා
ජනරජයේ අතිගරු ජනපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතු
මැතිනියයි.

එහෙත් සිය දෙමව්පිය අගමැතිවරුන් සමයේ රටේ තිබූ දරුණ
අභියෝග වලට වඩා හාත්පසින්ම වෙනස් වූ බෙදුම්වාදී යුද්ධයේ
දරුණු අභියෝගය අපේ දේශයේ ගොඩනැගෙමින් තිබිණ. එමෙන්
රටේ පැවති රුදුරු භීෂණය ඉදිරියේ අපේ රට මිනී කන්නන්ගේ
දේශය ලෙස ජාත්‍යන්තර මට්ටමින් ප්‍රචාරයක් ගොඩනැගී තිබූ කා
පරිච්ඡේදයකි.

මේ කාලයේ දේශයට අවශ්‍ය වූයේ සාමයේ අරුණළු පමණ
සමස්ත දේශවාසී ජනතාව අයැද සිටියේ දේශයේ සාමයයි. ඇය
සැමියා සමඟ රුදුරු ත්‍රස්තවාදීන් සමඟ සාකච්ඡා කරන්නට, සාකච්ඡා
කොට යුද්ධය පලවා හැර සාමය උදා කරන්නට සාමය උදා කොට
බෙදුම්වාදීන්ගෙන් රට බේරා ගන්නට ස්ථිර සාමයක් සඳහා වූ අපරිමි
කැපකිරීමක් කර තිබුණි.

මේ පසුබිම ඉදිරියේද තම දෙමවුපියන්ට මෙන්ම ඇයටද දැවැන්
අභියෝග තිබිණ. කුමන්ත්‍රණ තිබිණ. අපහාස උපහාස තිබිණ. ඇය
මේ සියල්ල ඉදිරියේ තමන්ගේ දේශමාමකත්වයේ සිතිවිලි ජනතාව
දෙසට යොමුකර හැරියාය.



දේශයේ සාමයේ නිර්ව්‍යාජ ප්‍රතිමූර්තිය...

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ

ජනාධිපතිනි අතිගරු

**චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය**

රුදුරු ශ්‍රී ලාංකීය ප්‍රතිගාමිත්වය විසින් විජය කුමාරතුංග මැතිඳුන්ටද අවසාන තීන්දුවක් සූදානම් කර තිබිණි. ඒ සොඳුරු මානව හිතවාදී නායකයාට වෙඩි උණ්ඩයෙන් බිම දමන්නට ඔවුහු තීරණය කළහ. මේ අවස්ථාවේදී කොළඹ පොල්හේන්ගොඩට ගැලූ ජන ගංගාව කොතෙක්දැයි තීරණය කරන්නට හැකි වීද? මිනිසුන් ඒ තරමටම ඔහුට ආදරය කළහ. ගෞරව කළහ. ඇතැම්හු සිත් වේදනාවෙන් සිරුරට ගිනි තබාගෙන මිය ගියහ. මාස ගණනක් යන තුරු රටේ ඛේදනීය තත්වයක් පැවතිණ.

1. බස්නාහිර පළාත් සභාව පැවතියේ එ.ජා.ප. පාලනය යටතේය. 1993 පැවති බස්නාහිර පළාත් මැතිවරණයේදී බස්නාහිර පළාත් සභාව පොදුජන එක්සත් පෙරමුණට අති විශිෂ්ඨ අයුරින් ජයග්‍රහණය කිරීමට හැකි වූයේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ ඉමහත් ධෛර්යය හා කැපවීම නිසාය. එපමණක්ම නොවේ පළාතේ ජනතාවද එතරම්ම එතුමිය කෙරෙහි තැබූ විශ්වාසය නිසාය.
2. ඒ වතාවේ එතුමිය බස්නාහිර පලාතේ මහ ඇමතිනිය ලෙස විශිෂ්ඨ ජයග්‍රහණයක් ලැබුවාය. ඒ සමඟ ජනතාවට ලැබුනේ ඉතා සවිමත් පලාත් සභාවකි. එදා සිට බස්නාහිර පළාත් සභාව කිසි දිනෙක වෙනත් පක්ෂයකට නතු වූයේ නැත.
3. බස්නාහිර පළාත් සභාවේ නිලධාරීන් සහ දූර්වලව පැවති සියලු දේ ප්‍රතිව්‍යුහ ගත කොට නිසි ඵලදායී සේවයක් මහජනයාට සිදු වන අයුරින් පළාත් සභාව නිර්මාණය කිරීම නිසා හෙටත් බස්නාහිර පලාත වෙනත් කිසිදු පක්ෂයකට හිමි නොවනු ඇත.
4. බස්නාහිර පළාත් සභාවේ මහ ඇමති ධූරය යටතේ පැවති අමාත්‍ය තනතුරු වල ප්‍රයෝජනය ඉමහත් ඵලදායිතාවයක් වන පරිදි ජනතාව අතර බෙදා හැරියාය.

5. 1993 දී පැවැත්වූ පළාත් සභා මැතිවරණයෙන් මහ ඇමතිනිය කොට, 1994 පාර්ලිමේන්තු මැතිවරණයෙන් ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ අග්‍රාමාත්‍ය ධූරයට පත් කොට එම වසරේම පැවති ජනපතිවරණයේදී ඇයට ජනාධිපති කිරුළ පළඳවන්නට ශ්‍රී ලාංකීය ප්‍රගතිශීලී ජනතාව බලවේගයක් ලෙස ක්‍රියා කරන ලදී. වියරු දේශපාලනයෙන් වද හිංසා විඳි ලාංකීය ජන සමාජය සැනසුම් සුසුම් හෙළන්නට වූයේ මේ ජනතා ජයග්‍රහණය නිසා නැවත ඇතිවූ ජනතා ආධිපත්‍යයෙනි.

6. 1994 වර්ෂයේ දී ශ්‍රී ලංකා ජනරජයේ අතිගරු ජනාධිපතිනිය වූ පසුද මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍ය ධූරය රඳවා ගත්තේ අතිගරු ජනපතිනිය යටතේම ය. එම නිසාම නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු විය. අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව ප්‍රබෝධයක් ඇති කරමින් රටේ දරුවනට අධ්‍යාපනයේ නිසි ඵල ලැබිණ.

7. එමෙන්ම රජයේ ගුරුවරුන්ගේ වැටුප නොසිතූ මට්ටමකින් වැඩි කෙරිණ.

8. ජාතික විශ්ව විද්‍යාල රැසක් පිහිටුවන ලදී. එනම් රජරට විශ්ව විද්‍යාලය, සබරගමුව විශ්ව විද්‍යාලය, වයඹ සහ දිගාමඩුල්ල යන විශ්ව විද්‍යාලයි. මේ තුළින් උසස් අධ්‍යාපනයේ දොර විවර නොවූ ලක්ෂ සංඛ්‍යාත දරුවන් පිරිසකට උසස් අධ්‍යාපනය ලැබිණ, කාර්මික අධ්‍යාපනය ලැබිණ. විද්වතුන් රැසකට උසස් රැකියා ලැබිණ.

9. ජනාධිපති කාර්යසාදක බලකායවල් පිහිටුවීම තුළින් රටේ හඳුනාගත් දැවෙන ප්‍රශ්න සෘජුවම රාජ්‍ය නායිකාවගේ මැදිහත් වීමෙන් විසඳීම සඳහා වූ මහඟු සංකල්පයක් ක්‍රියාවට නැගිණ.

10. සමෘද්ධි සංකල්පය නිර්මාතෘ අතිගරු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියයි. මේ යටතේ අද සමෘද්ධි බැංකු පිහිටුවා ලක්ෂ සංඛ්‍යාත පිරිසකට ණය පහසුකම්, ඉතුරුම් පහසුකම් ආදී බැංකු පහසුකම් සැපයීමෙන් ග්‍රාමීය කර්මාන්ත සහ කෘෂිකර්මාන්ත ක්ෂේත්‍රයන්හි යථාර්තවාදී අභිවෘද්ධියක් සැලසිති.

සමෘද්ධි සංකල්පය තුලින් රැකී රක්ෂා රාජ්‍ය අංශයේ මෙන්ම ග්‍රාමීය ආර්ථිකයේ වෙනත් ක්ෂේත්‍රවල ලක්ෂ සංඛ්‍යාත ප්‍රමාණයක් බිහි වීම.

11. නිවට බියගුළු යටත්වීමක් ලෙස නොව සටන් විරාමය නීතිගත ගිවිසුමක් ලෙස එතුමිය විසින් ඉදිරිපත් කරන ලදි.

12. දේශයේ සෑම ජන කොට්ඨාශයකම (සිංහල දෙමළ මුස්ලිම්) අයිතිය සුරැකෙන පරිදි සාමය සඳහා වූ යෝජනා ඇතුලත් යෝජනාවලියක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. දේශයේ ජනතාව සහ දේශයේ සාමය සහජීවනයය වෙනුවෙන් යුද්ධය නොව සාමය සඳහා වූ සත්‍යවාදී මඟක් පෙන්නුම් කරන්නා වූ එම යෝජනාවලිය පාර්ලිමේන්තුවේදී එ.ජා.පය. විසින් ද්වේශයෙන් ගිනිතබා විනාශ කරන ලද්දේය.

13. සාමය සඳහා වූ යෝජනා ජාත්‍යන්තර මට්මටමකට ගෙනයාම. තෙවන පාර්ශවයක් ලෙස නොර්වේ රාජ්‍යයට ආරාධනා කිරිම අතිගරු ජනාධිපතිනිය විසින් ගන්නා ලද තවත් වැදගත් තීරණයකි.

14. දේශයේ සාමය වෙනුවෙන් විනා දේශ ද්‍රෝහී සාමයකට එතුමිය සූදනම් නොවීම සුවිශේෂ කාරණයකි. නිර්ව්‍යාජ වූ සැබෑ සාමයක් රටට අවශ්‍ය හෙයින් ඒ සඳහා වූ ක්‍රම සම්පාදනය එතුමියගේ මැදිහත් වීම තුළම කරන ලදි.

15. දිළිඳුකම පිටුදැකිම සඳහා වෙනම අමාත්‍යාංශයක් ස්ථාපිත කොට සමෘද්ධි වැඩ පිළිවෙල තුල ජන සහභාගීත්වයක් ඇති පිරිසිදු රාජ්‍ය ව්‍යවසායක් ගොඩනැගීම.

මෙම කුඩා පොත් පිංවෙහි මීට වඩා ඇතුළත් කළ නොහැකි වුවත් අතිගරු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ

රාජ්‍ය සමයේ දේශය සහ ජනතාව කෙරෙහි ගනු ලැබුවාවූ ප්‍රගතිශීලි ජන මෙහෙවරයන් පිළිබඳව රටේ ජනතාව සහ ජාත්‍යාන්තර ප්‍රජාව කරුණු මැනවින් දන සිටිති.

වර්තමානයෙහි භීෂණය ආගිය අතක් නැත. දූෂණය බොහෝ දුරට රාජ්‍ය තන්ත්‍රයෙන් ඈත්ව තිබේ. ජනතාවාදී ක්‍රමසම්පාදනය ප්‍රගතිශීලී මහක් ඔස්සේ ඈතට දිවේ. ශ්‍රී ලංකාවේ නෙවන ප්‍රගතිශීලී රාජ්‍ය පාලන යුගය තවදුරටත් බොහෝ කලක් පවතිවා, අපේ දේශය සත්‍යවාදී දැහැමි රාජ්‍ය පාලන තන්ත්‍රයක් තුළම ගමන් කරත්වා යන්න දේශයේ සැම දෙනාගේම ප්‍රාර්ථනය වේ.

මේ ජනගංගාව තවත් බොහෝ කලක් ඉදිරියට ගලායනු ඇත.

මා මෙතෙක් ඔබට කතා කල ශ්‍රී ලාංකීය දේශපාලනයේ තුන් යුගය වසර 50 කට ආසන්න කාලයක් පුරා විකාශනය වූවකි. ලාංකීය ප්‍රගතිශීලී දේශපාලනයේ 45 වසරක් සැරිසරා අත්දැකීම් ලබා සිටින පුද්ගලයෙකු ලෙස නව පරපුරට මෙබඳු සටහනක් හෝ ලියා තැබීම තුළ කිසියම් වටිනාකමක් පැවතිය හැකිය. මා ඉදිරිපත් කළ කරුණු බොහෝ කෙටි සටහන් බවට පත් වූයේ ලේඛන කලාව මා විසින් ප්‍රගුණකොට නොමැති බැවිනි. හුදෙක් මා ලේඛකයෙක් වූයේ නම් ඔබට මීට වඩා බොහෝ දේ මා තුළින් හෙළිවනු ඇත. එම නිසා 45 වසරක මගේ ජීවිතය සම්බන්ධ වූ සංක්ෂිප්ත යුග ආවර්ජනයක් ඔබ ඉදිරියේ තබමි.

**1** **1960**

අතිපූජ්‍ය උඩකැන්දවල සිරි සරණංකර මාහිමි ඇතුළු මෙරට වාමාංශික ව්‍යාපාරයේ ප්‍රබල පුද්ගලයින් සමග දේශපාලනයට අවතීර්ණ වීමි. අනතුරුව ශ්‍රීලනිප සාමාජිකත්වය ලබා ගතිමි.

**2** **1961**

රුමේනියානු සමාජවාදී ජනරජයේ විශේෂ ශිෂ්‍යත්වයක් මත දේශපාලන න්‍යායික පුහුණුවක් ලැබීම සඳහා විදේශගත වීමි.

**3** **1962**

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ක්‍රියාකාරි දේශපාලනයට පිවිසියෙමි.

**4** **1963**

එවකට ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මිනුවන්ගොඩ ප්‍රධාන සංවිධායක මහජන මන්ත්‍රී එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන මහතා හා සම්බන්ධ වීමි.

**5** **1964**

ඇම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන මහතා සමග සම්බන්ධ මිනුවන්ගොඩ ආසනයේ ක්‍රියාකාරි දේශපාලනයට පිවිසියෙමි.

**6** **1965**

මිනුවන්ගොඩ ආසනය පුරා ශ්‍රීලනිප ශාඛා සමිති පුළුල් සංවිධානය කිරීම. තරුණ කාන්තා සමිති පිහිටුවීම. ශ්‍රී ලංකා ස සමාජ පක්ෂය හා කොමියුනිස්ට් පක්ෂය සමග සන්ධානගතව සම පෙරමුණ පිහිටුවීමට දායක වීමි.

**7** **1966**

තරුණ සහ කාන්තා සමිති ක්‍රියාශීලි සමිති බවට පරිවර්තන කිරමින්. මිනුවන්ගොඩ ආසනයේ 2000 කට අධික තරුණ පිරිස පක්ෂයට සම්බන්ධ කළෙමි.

**8** **1967**

එම තෝරාගත් තරුණ පිරිසට පක්ෂයේ දේශපාලන කටයු පිළිබඳව විශේෂ පුහුණුවක් ලබාදී ආසනය පුරා දේශපාලනික කටයුතුව නිරත කලෙමි.

**9** **1968**

ආරම්භ කල දා පටන්ම එජාප බලකොටුවක් වූ උඩුගම්පොල ගම් කාර්ය සභාව ශ්‍රීලනිපයට නතු කර ගැනීමට සමත් වූයෙමි. සමස්ථ ලංකා මට්ටමින් ශ්‍රීලනිප යෙහි තරුණ කටයුතු සම්බන්ධීකරණයට සහාය වීමි.

**10** **1969**

උඩුගම්පොල ගම්සභා මැතිවරණයේදී එජාපය පරාජය කර ප්‍රථම වතාවට ශ්‍රීලනිප පාලනයක් පිහිටුවීමට හැකිවිය. මිනුවන්ගොඩ ආසනයේ තරුණ බල මණ්ඩලයේ සභාපති ලෙස ඒකච්ඡන්දයෙන් පත්වීමි.

**11** **1970**

මහ මැතිවරණයේ මිනුවන්ගොඩ ප්‍රධාන සංවිධායක (සමගි පෙරමුණ) අපේක්ෂකයා වූ එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන මහතාගේ ජයග්‍රහණය සඳහා තරුණ බලමණ්ඩල සභාපති වශයෙන් අති විශාල කාර්ය භාරයක් ඉටු කලෙමි. මිනුවන්ගොඩ ආසනයේ ජනතා ජයග්‍රහණයට දායක වීමි.

**12** **1971**

සමගි පෙරමුණු රජය යටතේ මිනුවන්ගොඩ ආසනයේ ක්‍රියාත්මක කිරීම සඳහා විශාල කාර්යභාරයක් භාර ගතිමි. අප්‍රේල් කැරැල්ලට සම්බන්ධ තරුණයන් රාශියක් පුනරුත්ථාපනයට යොමු කොට ඔවුන්ට හොඳ ජීවිතයක් ගත කිරීමට මං පෙත් සැලසීමි. තරුණ කඳවුරු වලට ගොස් පෞද්ගලිකවම සහන සැලසීමට කටයුතු කළෙමි.

**13** **1972**

උඩුගම්පොල සමූපකාර සමිතියේ සභාපතිවරයා වශයෙන් පත්විමි. උඩගම්පොල සමූපකාරය පිළිබඳ පුළුල් අධ්‍යයනයක් කොට දුර්වලතා හඳුනා ගතිමි. අනතුරුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධ්‍යක්ෂ වරයෙකු වශයෙන් වැඩ භාරගතිමි.

**14** **1973**

උඩුගම්පොල සමූපකාර සමිතිය ආසනය පුරා ව්‍යාප්ත කළෙමි. ක්ෂීර ගොඩනැගිලි ලබාදී විශාල සමූපකාරිකයන් පිරිසක් සමිතියට සම්බන්ධ කොට සාමාජිකත්වය ව්‍යාප්ත කළෙමි.

**15** **1974**

වත්මන් ජනපතිතිය සහ එවකට ඉඩම් සහ කෘෂිකර්ම ඇමති හෙක්ටර් කොබ්බෑකඩුව මහතා සමඟ ඉඩම් ප්‍රතිසංස්කරණ කටයුතු වලට සම්බන්ධ වී මිනුවන්ගොඩ ආසනයේ ඉඩම් නොමැති ජනතාවට ඉඩම් කැබලි සහ වාසස්ථාන ලබාදීමට කටයුතු කළෙමි.

**16** **1975**

මේ වන විට සමඟි පෙරමුණ රජයේ හටගත් විවිධ අර්බුද හමුවේ ශ්‍රීලනිපය සහ එහි ප්‍රතිපත්ති ආරක්‍ෂා කරමින් ජනතාව මෙහෙයවමින් පක්‍ෂය ආරක්‍ෂා කර ගැනීම සඳහා වූ විවිධ කටයුතු වලට ජාතික මට්ටමින් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට සහාය වීමි.

**17** **1976**

ශ්‍රීලනිප ආරක්‍ෂා කර ගැනීම සඳහා දිවයිනේ විවිධ පලාත්වල පැවති සාකච්ඡා සහ වැඩ සටහන් වලට සම්බන්ධ වීමි. පක්‍ෂය සමඟ එක්ව කටයුතු කළෙමි.

**18** **1977**

මහ මැතිවරණයක් එළඹිණ. එම්. පී. ද ඉසෙඩ් සිරිවර්ධන මහතා දේශපාලනයෙන් ඉවත් වූ බැවින් එම පුරප්පාඩුව පිරවීම සඳහා ඉදිරිපත් වූ ජේ. ආර්. පී. සූරියප්පෙරුම මහතාගේ මැතිවරණ ව්‍යාපාරයට සහයෝගය ලබා දුනිමි.

එහෙත් සමගි පෙරමුණු රජය බිඳ වැටිණ. එජාප කුරිරු වියරු ප්‍රචණ්ඩත්වය විසින් රට පුරා දේශපාලන පළිගැනීම් උග්‍ර අතට හැරවිය. පොලීසියට දින නියමයක් නොමැතිව නිවාඩු ලබා දී ප්‍රතිවාදී දේශපාලනඥයන්ගේ ජීවිත හා දේපල විනාශ කිරීමට පටන් ගති. ඒ අනුව උඩුගම්පොල පිහිටි මට අයත් එකම නිවස සහ සියළු දේපළ එජාප ප්‍රචණ්ඩකාරීන් විසින් ගිනි තබා විනාශ කරන ලදී.

මටත් මගේ බිරිඳ හා දරුවන්ටත් ඉතිරි වූයේ ඇඳිවත පමණි. එහෙත් කුඩා අර්ජුන ක්‍රිකට් පිත්ත පමණක් ආරක්‍ෂා කර ගන්නා ලදී. ආහාර පවා නොමැති විය.

එදා අර්ජුන විසින් රැකගත් ක්‍රිකට් පිත්ත තුළ අපරිමිත බලයක් තිබිණැයි මට සිතේ. පසු කලෙක ඔහු තුළ වූ ශක්තිය ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර කීර්තියක් ලැබීමට හේතු විය.

**19** **1978**

යලිත් වරක් ශ්‍රීලනිප ය මෙන්ම අපගේ පෞද්ගලික ජීවන පරිසරයද ව්‍යාකූල වී ගිය බැවින් දුෂ්කර සමයක් උදා වීය. එහෙත් මිනුවන්ගොඩ ආසනයේ දේශපාලන කටයුතු හැකි උපරිමයෙන් කිරීමට අධිෂ්ඨාන කර ගතිමි. පක්ෂ සාමාජිකයින් එකතු කර ගනිමින් ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ඉල්ලීම මත පූර්ණකාලීන දේශපාලනයට පිවිසියෙමි.

**20** **1979**

මේ වන විට දවසේ වැඩි කොටසක් මැතිනියගේ වැඩ සටහන් වලට සහභාගී වීමට සිදුවිය. ලංකාවේ විවිධ පලාත්වල එජාප භීෂණයෙන් අතරමං වූ පවුල්වල සුභ සිද්ධිය සඳහා කටයුතු කිරීම පිණිස නික්ම ගියෙමි.

**21** **1980**

ජූලි වැඩ වර්ජනයේදී එජාප රජය විසින් රැකියාවෙන් දොට්ට දැමූ දහස් සංඛ්‍යාත වර්ජකයක් හමුවී සාකච්ඡා කොට සංවිධාන පිහිටුවා වර්ජකයන් ශක්තිමත් කිරීම සමස්ත ලංකා මට්ටමින් ක්‍රියාත්මක කළෙමි.

**22** **1981**

ජනාධිපතිවරණයට පෙර පක්ෂ තුල ඇතිවූ බෙදීයාමේ තර්ජනයක් හමුවේ ගරු මැතිනිය සමඟ සිටිමින් එතුමියගේ නායකත්වය ආරක්ෂා කර ගැනීමට උරදී පක්ෂයේ විනය ආරක්ෂා කර ගැනීම සඳහා දිවි පරදුවට තබා කටයුතු කළෙමි.

**23** **1982**

ජේ. ආර්. ජයවර්ධනගේ ජනමත විචාරණ ප්‍රෝඩාවට එරෙහිව ශ්‍රීලනිප මෙහෙයවූ දීප ව්‍යාප්ත උද්ඝෝෂණ සංවිධානය කොට ඒවාට සහභාගි වීමි. 82 ජනාධිපතිවරණයෙන් ශ්‍රීලනිපය දිනවීම සඳහා දැඩි ලෙස කැපව ක්‍රියාකොට මැතිවරණ දූෂණ හමුවේ පක්ෂයට විශාල ඡන්ද සංඛ්‍යාවක් ලබා ගැනීමට කටයුතු කළෙමි.

## 24 1983

පරාජිත, අරාජික, දූෂිත දේශපාලන පරිසරයක් හමුවේ මිනුවන්ගොඩ ආසනයේ සාමාන්‍ය ශ්‍රීලනිප සාමාජිකයෙකු ලෙස ජනතාව ආරක්ෂා කරමින් ගරු මැතිනියගේ ප්‍රජා අයිතිය අහෝසි කිරීමට එරෙහිව ජනතාව සංවිධානය කළෙමි.

මැතිනියගේ ජීවිතය විනාශ කිරීමට ගම්පහ දී එජාප ත්‍රස්තයන් විසින් ගැසූ බෝම්බයෙන් දිවි පරදුවට තබා එතුමිය බේරා ගැනීමට ලැබීම මා ජීවිතයේ ලද ලොකුම භාග්‍යය යැයි මම විශ්වාස කරමි.

## 25 1984

මේ වන විට මිනුවන්ගොඩ ආසනයේ ශ්‍රීලනිප ප්‍රධාන සංවිධායක ධූරයෙහි පුරප්පාඩුවක් ඇතිවිය. ශ්‍රීලනිපය විසින් නියෝග කරනු ලැබූ සියළු කටයුතු මා විසින් ඉටු කරනු ලැබීමි.

## 26 1985

මේ කාලයේ දිගින් දිගටම සාමාන්‍ය පුරවැසියෙකුට වඩා සුවිශේෂ ලෙස එජාප රාජ්‍ය ත්‍රස්තවාදයට මුහුණ දීමට සිදු විය. භීෂණකාරී වාතාවරණයක් තුළ ජනතාවට එල්ල වී තිබූ තර්ජන, ගර්ජන මිනිමැරුම් වලට එරෙහිව කටයුතු කරමින් ජනතාවට නායකත්වය දුනිමි.

## 27 1986

මා වෙත මිනුවන්ගොඩ ශ්‍රීලනිප ප්‍රධාන සංවිධායක ධූරය පිරිනැමිණ.

## 28 1987

එජාප රජයේ අත්තනෝමතික පාලනය විසින් ලංකාව පුරා ඇති කරන ලද ජාතික අර්බුදය තුල ජනතාවගේ යහපත සඳහා ගරු මැතිනිය සමඟ දිප ව්‍යාප්ත වැඩ සටහන් සංවිධානය කිරීම. ජාතිවාදයෙන් අසරණව සිටි ජනතාවට පිළිසරණ වීම. රට බේරා ගැනීම වෙනුවෙන් පැවැත්වූ බෝධිපූජා, සන්‍යග්‍රහ ආදියට මිනුවන්ගොඩ

ජනතාව සහභාගි කරවීම ආදී ජාතික මට්ටමේ වැඩ සටහන් වලට සහභාගි වීමි.

**29** **1988**

රුදුරු එජාප පාලනය විසින් ජවිපෙ භීෂණය ඇති කරන ලදී. මිනීමැරුම්, දේපල ගිනි තැබීම්, මංකොල්ලකෑම්, ස්ත්‍රී දූෂණ ආදී භීෂණ ක්‍රියා තුලින් හානියට පත් ජන කොටස් හමුවීම. ඔවුන්ට පහසුකම් සැලසීම. අතුරුදහන් වූවන් පිළිබඳව සොයා බලා කටයුතු කිරීම වැනි කටයුතු වල නිරතවීමි.

**30** **1989**

රටේ පැවති දරුණුම යුගය භීෂණය, මිනීමැරුම්, අතුරුදහන් කිරීම්, පහරදීම්, මැද එජාප වියරු දේශපාලනය පරදවා ප්‍රථම වරට 89 මහ මැතිවරණයේදී මීනුවන්ගොඩ ආසනයෙන් ගම්පහ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරී පත්වීමි.

**31** **1990**

ශ්‍රීලනිප ය තුල නායකත්වය පිළිබඳ අර්බුදයක් ඇති විය. එහිදී ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය වෙනුවෙන් කටයුතු කරමින් මැතිනිය ආරක්‍ෂා කර ගැනීමට මගේ උපරිම ශක්තිය ලබා දුනෙමි. මගේ පාර්ලිමේන්තු මන්ත්‍රී වරප්‍රසාද මූල්‍ය ප්‍රතිපාදන පළමුවරට ගම්පහ දිස්ත්‍රික්කයේ සියළුම ආසනවල සංවර්ධන වැඩ සඳහා ජනතාවට ලබා දීමට කටයුතු කළෙමි.

**32** **1991**

ගම්පහ දිස්ත්‍රික්කයේ අධ්‍යාපන, මහා මාර්ග සංවර්ධනය ආදී සංවර්ධන වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීම. අතුරුදහන් වූවන් පිළිබඳව ජාත්‍යන්තර මානව හිමිකම් කොමිසමට සමීක්‍ෂණ වාර්තා තොරතුරු සහ ඡායාරූප ආදිය ඉදිරිපත් කිරීම සඳහා ප්‍රංශය බලා පිටත්වීමට සිදු විය.

එම තොරතුරු මානව හිමිකම් කොමිසමට භාර දීමට විදේශ

කුමාරතුංග මැතිනියට විරුද්ධව කිසියම් පිරිසක් පක්ෂය තුල කුමන්ත්‍රණයක් කිරීමට සූදානම් වීම නිසා ප්‍රසන්න රණතුංග චන්ද්‍රිකා මැතිනියගේ ආරක්ෂාව වෙනුවෙන් යැවීම්. එහිදී චන්ද්‍රිකා මැතිනියට සහාය වීමට මටත් පක්ෂයේ නායකත්වය එතුමියට ලබා ගැනීම සඳහා සහාය වීමටත් අපට හැකිවිය. ප්‍රසන්න රණතුංග විසින් එතුමිය වෙනුවෙන් විශිෂ්ඨ වැඩ කොටසක් ඉටු කරන ලදී.

පළාත් පාලන මැතිවරණයෙන් මීනුවන්ගොඩ ප්‍රාදේශිය සභාව විශිෂ්ට ලෙස ජයග්‍රහණය කිරීමට කටයුතු සංවිධානය කිරීමටත් සිදුවිය.

## 33 1992

වත්මන් ජනපතිනි අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ දේශපාලන කටයුතු වලට සම්බන්ධ වෙමින් එතුමිය සමඟ මීනුවන්ගොඩ ජනතාව සංවිධානය කිරීම සඳහා කාලය වෙන් කරන ලදී.

## 34 1993

බස්නාහිර පළාත් සභා මැතිවරණයෙන් ගම්පහ දිස්ත්‍රික්කය තුළ වාර්තාගත පරිදි එක් දින රැස්වීම් මාලාවක් පවත්වන ලදී.

ප්‍රථම වරට එක් දිනක් තුළ එනම් පෙ.ව. 9.00 සිට රාත්‍රි 12.00 දක්වා රැස්වීම් 157 ක් චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය වෙනුවෙන් පවත්වන ලදී. එම රැස්වීම් මාලාවට සමාන්තරව දැවැන්ත රථ පෙළපාලියක් පැවැත්වීමට අපට හැකි විය. ප්‍රසන්න රණතුංග බස්නාහිර පළාත් සභා මැතිවරණයෙන් 4 වෙනි ස්ථානයට තේරී පත්වීමත් අමාත්‍ය ධූරයක් ලැබීමත් සිදු විය.

## 35 1994

නැවත පාර්ලිමේනතු මැතිවරණයක් එළඹිණ. දෙවන වරටත් මීනුවන්ගොඩ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ලෙස පත්වීම්.

ඉන් පසු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ අති විශිෂ්ට ජයග්‍රහණය වෙනුවෙන් මීනුවන්ගොඩ ආසනය සංවිධානය කිරීම, ජනපතිනියගේ අති විශිෂ්ඨ ජයග්‍රහණය වෙනුවෙන් පක්ෂය විසින් සංවිධානය කල සියලු වැඩ කටයුතු වලට සහභාගි වීම්.

දකුණු පළාත් සභා මැතිවරණය වෙනුවෙන් නේවාසිකව සිටිමින් දකුණේ කඹුරුපිටිය ආසනය මෙහෙයවීමට දායක වීමි. එම මැතිවරණයේදී දකුණු පළාතෙන් ආසනයක් ලැබූ වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබා දීමට දායක විමි. දකුණු පලාත් සභාව අති විශිෂ්ට ජයග්‍රහණයක් ලැබිය.

**36** **1995**

ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාව වෙත අති දැවැන්ත සංවර්ධන යෝජන රැසක් ක්‍රියාත්මක කිරීම. පළාත් සභා අමාත්‍යංශ 6 ක් එනම්, ප්‍රවාහන, මහා මාර්ග, විදුලිවල, නිවාස, යෞවන කටයුතු, ක්‍රීඩා පිළිබඳ ගරු අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමාගේ අරමුදල් සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රතිපාදන අරමුදල් ගම්පහ දිස්ත්‍රික්කයේ සංවර්ධනය උදෙසා ලබ දීමට හැකි විය.

ජාතික වොලිබෝල් සංගමයේ සභාපති ධුරයට මා තෝරා පත් කර ගන්නා ලදී.

**37** **1996**

ප්‍රථම වරට පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය අමාත්‍ය ධුරයකින් පිදුම් ලදිමි. ප්‍රවාහන, පාරිසරික හා වනිතා කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ධුරයේ වැඩ භාර ගතිමි.

මේ අවස්තාවේදී අර්ජුන රණතුංග ඇතුළු ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම එම තරගාවලියේදී විශිෂ්ට ලෙස ක්‍රීඩා කරමින් ලෝක කුසලානය හිමිකර ගත්හ. එම අවස්තාව ශ්‍රී ලංකාවට ඉමහත් කීර්තියක් රැගෙන ආ සිද්ධියක් විය. මා ජීවිතයේ ඉහළම සතුටක් ලැබූ අවස්ථාව මෙය බව කිවහොත් එය නිරවද්‍යය.

ලොව දිනූ පුතුන් හැටියට ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ජනතා ප්‍රතිචාර හමුවේ ලංකාවට පැමිණියහ.

**38** **1997**

ශ්‍රී ලංකාවේ ප්‍රවාහන ක්ෂේත්‍රයේ පැවැති දේශපාලන පළිගැනීම් වලට ලක් වුවන්ගේ තත්ත්වය සොයා බලා වන්දි ලබා ගැනීමට

උසස්වීම් ලබා ගැනීමට ජනාධිපතිනියගේ සහාය ලබා ගනිමින් ඔවුනට වන්දි ලබාදීමට හැකි විය.

පළාත් පාලන මැතිවරණය වෙනුවෙන් ඉදිරිපත් වූ අඩු ආදායම්ලාභී සෑම ප්‍රාදේශීය සභා මන්ත්‍රී අපේක්ෂකයෙකුටම ජනපතිනිය විසින් ලබාදුන් මුල්‍යාධාර ඔවුන් වෙත ලබා දීමට කටයුතු කළෙමි.

මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව පොදුජන එක්සත් පෙරමුණේ අති විශිෂ්ඨ ජයග්‍රහණයක් වාර්තා කලේය.

පො.එ.පෙ. රජයේ වරාය සංවර්ධන නාවික හා පුරුත්ථාපන නියෝජ්‍ය ඇමති ධූරය අතිගරු ජනාධිපතිතුමිය විසින් මා වෙත පිරිනමන ලදී.

**39** **1998**

රැකියා අවස්ථා දහස් ගණනක් රටේ විවිධ ප්‍රදේශවලට, මිනුවන්ගොඩ ආසනයට සහ ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට ලබා දීමට අවස්ථාව උදා විය.

මුස්ලිම් කොන්ග්‍රස් නායක අෂ්රොප් මැතිතුමා සමග මුස්ලිම් ජනතාවගේ සුභසාධනය සඳහා වූ විවිධ පුනරුත්ථාපන කටයුතු වලට සහභාගි වීමට ගියෙමි. 80 වර්ජකයන් සඳහා අතිගරු ජනපතිනියගේ අනුග්‍රහයෙන් රැකියා අහිමිවූවන්ට කෝටි ගණනක වන්දි ලබාදීමට මා විසින් කටයුතු කරන ලදී.

**40** **1999**

වයඹ පළාත් සභා මැතිවරණය. පොදුජන එක්සත් පෙරමුණේ ජයග්‍රහණය වෙනුවෙන් අති විශිෂ්ට කාර්යභාරයක් ඉටු කිරීමට හැකි විය.

බස්නාහිර පලාත් සභා මැතිවරණය එළඹිණ. ගම්පහ දිස්ත්‍රික් කණ්ඩායම් නායක ලෙස අතිගරු ජනාධිපතිනිය විසින් ප්‍රසන්න රණතුංග මැතිතුමා පත් කරන ලදී. කොළඹ, කළුතර දිස්ත්‍රික්කවලින් පො.එ.පෙ. ලද ඡන්ද ප්‍රතිශතයේ පසුබෑම හමුවේ ගම්පහ දිස්ත්‍රික්කයෙන්

වැඩි ඡන්ද ප්‍රතිශතයක් ලබා දෙමින් පොදුජන එක්සත් පෙරමුණට විශිෂ්ට ජයග්‍රහණයක් ලබා දීමට හැකි විය.

99 ජනාධිපතිවරණයේදී අතිගරු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ විශිෂ්ට ජයග්‍රහණය උදෙසා සමස්ත ලංකා මට්ටමින් ක්‍රියාත්මක වෙමින් මීනුවන්ගොඩ ආසනයේ අති විශාල ඡන්ද සංඛ්‍යාවක් එතුමියට ලබාදීමට කටයුතු කළෙමි.

මේ අවස්ථාවේදී අතිගරු ජනපතිනිය විසින් මා වෙත සිවිල් ගුවන් සේවා හා ගුවන් තොටුපල සංවර්ධන කැබිනට් අමාත්‍ය ධූරය පිරිනමන ලදී.

## 41 2000

පාර්ලිමේන්තු මැතිවරණය එළඹිණ.

තුන්වන වතාවටත් මීනුවන්ගොඩ ආසනයෙන් ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස නැවත පත්වීමි.

ඒ අවස්ථාවේදී පොදුජන එක්සත් පෙරමුණු රජය රැක ගැනීම සඳහා අතිගරු ජනපතිනිය විසින් ප්‍රදානය කළ වරාය, නාවික සංවර්ධන අමාත්‍යධූරය මුසලිම් කොංග්‍රසයේ රවුෆ් හකීම් මහතා වෙත පරිත්‍යාග කළෙමි.

ඉන් ටික වේලාවකට පසුව ශ්‍රී ලංකා ජන රජයේ ආහාර සහ අලෙවි සංවර්ධන ඇමතිවරයා ලෙස අතිගරු ජනපතිනිය විසින් මා පත් කරන ලදී.

දිවයින පුරා ආර්ථික මධ්‍යස්ථාන කිහිපයක් පිහිටුවීම. වී මිලදී ගැනීමේ මධ්‍යස්ථාන ඇති කිරීම. මේ වන විට රජයේ, සංස්ථා සහ පෞද්ගලික අංශයේ රැකියා අවස්ථා 12000 ක් ඉක්මවා ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාව වෙත ලබාදීමට හැකිවූ බව සඳහන් කරමි.

ගම්පහ දිස්ත්‍රික්කයේ පාසල් දරුවන්ගේ අධ්‍යාපන සංවර්ධනය වෙනුවෙන් අති විශාල සේවයක් සලසනු වස් වර්ෂ 2000 ක් වූ අංක 28 දරණ රෙජී රණතුංග අධ්‍යාපන ශිෂ්‍යත්ව භාරකාර අරමුදල පාර්ලිමේන්තු පණත සංස්ථාපිත කොට එහි සභාපති ධූරයට පත් විය.

## 42 2001

පොදුජන එක්සත් පෙරමුණු රජයේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ධුරයට පත්වීම්.

2001 මහ මැතිවරණය 4 වන වතාවටත් ජයග්‍රහණය කොට මීනුවන්ගොඩ පාර්ලිමේන්තු මන්ත්‍රී වරයා ලෙස තේරී පත්වීම්.

දිවයිනේ සමස්ථයක් වශයෙන් පො.එ.පෙ. ආසන 21 ට පසු බසිද්දී, පොදුජන එක්සත් පෙරමුණු රජය බිඳ වැටෙද්දී මීනුවන්ගොඩ ආසනය ජයග්‍රහණය කරා මෙහෙයවීමට මට හැකි විය.

4 වන වතාවටත් ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් මීනුවන්ගොඩ ආසනයෙන් පාර්ලිමේන්තුවට ගියෙමි.

## 43 2002

2001 මහ මැතිවරණයෙන් පසුව එජාප රජයේ භීෂණ ක්‍රියාවලින් විපතට පත්වූ අයට සහන සලසා දීම. ගම්පහ දිස්ත්‍රික්කයේ බොරු චෝදනා මත සිරගත කරන ලද්දන් බේරා ගැනීම සඳහා පෞද්ගලික ධනය වැය කොට ඔවුන්ගේ පවුල්වලට සුභසාධන කටයුතු කිරීම. අතිගරු ජනපතිනියගේ ඉල්ලීම මත ශ්‍රීලනිපයේ සමස්ත ලංකා මට්ටමින් සිදු කරන ලද ආසන ප්‍රතිසංස්කරණ කටයුතු වල නිරත වුයෙමි.

අතිගරු ජනපතිනිය විසින් පක්ෂයේ ආසන ප්‍රතිසංවිධාන කටයුතු වෙනුවෙන් මහනුවර දිස්ත්‍රික් සම්බන්ධීකරණ ලේකම්වරයා ලෙස මා පත් කරන ලදී. එම කටයුතු නිසියාකාරව ඉටු කරනු ලැබුවෙමි.

## 44 2003

අතිගරු ජනපතිනිය විසින් පක්ෂයේ ප්‍රතිසංවිධාන කටයුතුවල දෙවන පියවර ඇරඹිය. උතුරු මැද පලාත, වයඹ පලාත යන පළාත් දෙකෙහි ප්‍රතිසංවිධාන කටයුතු මෙහෙයවීමට මා පත් කරන ලදී.

පසුගිය පක්ෂ සම්මේලනයේදී ප්‍රතිසංවිධාන කටයුතු පිළිබඳ පැවරු කාර්යයන් සාර්ථකව නිම කිරීම අගය කරමින් අතිගරු ජනපතිනිය විසින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උප ලේකම් තනතුරට මා

විය.

පත් කරන ලදී.

ගම්පහ දිස්ත්‍රික් ශ්‍රීලනිප ප්‍රධාන ලේකම් ලෙස ඒකඡන්දයෙන් පත්වීමි.

19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ අතිගරු ජනාධිපතිනියට විරුද්ධ කුමන්ත්‍රණයට එරෙහිව කටයුතු සංවිධානය කරනු ලදිමි. එක්සත් ජනතා නිදහස් [illegible]නය බිහිකිරීම සඳහා වූ සියළු පුරෝගාමී කටයුතු වලටද දායක

45

## 45. 2004

දේශයේත් ලාංකීය මතු පරපුරේත් අභිවෘද්ධිය තේමා කොට ගත් එක්සත් ජනතා නිදහස් සන්ධානයෙහි ගම්පහ දිස්ත්‍රික් අපේක්ෂකයෙකු වශයෙන් පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වූයෙමි. ඒ මීට මාස ගණනකට පෙරය.

එම මැතිවරණයෙන් මා ලත් ඡන්ද සංඛ්‍යාව 56,000 ඉක්මවුවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් තේරී පත්වීමට මට අවස්ථාව උදා නොවීය. මා ලත් ඡන්ද සංඛ්‍යාව මගේ පරාජයක් යැයි මා කිසිවිටෙකත් නොසිතුවෙමි. 56,000 ක් වැනි ජන සංඛ්‍යාවක් මා වෙත විශ්වාසය තබා තිබේ. මා ඒ පිළිබඳ සතුටු වෙමි. මේ තාවකාලි විරාමයේ මගේ මතකය සමඟ ගොඩනැගුණු පිළිසඳර මම මෙම කෘතිය තුල සඳහන් කළෙමි. ඔබට මෙම සටහන් පෙලෙහි කිසියම් තෘප්තියක් හෝ ප්‍රයෝජනයක් ඇත්නම් එය මගේ සතුටට කරුණකි.

# පසුවදන

අද දිනය ක්‍රි. ව. 2004 දෙසැ. 26 වැනි ඉරිදායි. වේලාව උදෑසන... (නිශ්චිතවම කිව නොහැකියි) සාමාන්‍යයෙන් පෙ.ව. 7.00 ට පමණ.

වසර 2000 ක් පමණ ඉතිහාසයේ කවර දිනයක්වත් නොවූ විරූ ඉතා ඛේදනීය තත්වයකට ශ්‍රී ලාංකීය ජනතාවටත් සමස්ථයක් ලෙස රටටත් මුහුණ දීමට සිදුවිය. මගේ මේ කුඩා කෘතිය තුල පසුවදනෙහි මේ පුවත සඳහන් කරන්නේ මතු පරපුරේ ප්‍රයෝජනය සඳහා දැනගැනීම පිණිස ය.

අද දින අපේ රටේ වෙරල තීරය සීමාව කිවහොත් යාපනයේ සිට මඩකලපුව හරහා පානම, හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, කොළඹ හරහා පුත්තලම තෙක් මුහුදු තීරය ජල රකුසා විසින් රුදුරු ලෙස බිලිගන්නා ලදී. මහ මුහුද ගොඩ ගැලිය.

භූ ගර්භ විද්‍යාඥයින්ගේ සටහන් අනුව ඒකක 8.9 ක් තරමේ බලවත් සුනාමි තරංග පැයට සැතපුම් 200 සිට 700 දක්වා වේගයෙන් වෙරළ තීරයට පැමිණ තිබේ. ශ්‍රී ලංකාවේ සිට සැ. 1700 ක් පමණ ඈතින් ඉන්දුනීසියාවට අයත් වූ අන්දමන් දූපත් හා සුමාත්‍රා දූපත් අතර කි. මී. 10 ක් පමණ ගැඹුරු මුහුදු පත්ලේ සිදුවූ භූ කම්පනයක් නිසා මෙම සුනාමි තරංග හටගෙන තිබේ. පැමිණි රැල්ලේ උස අඩි 35 ක් පමණ යැයි කියැවේ.

සාගරය අසලින් වැටී ඇති මුහුදුබඩ මාර්ගයේ ගමන් ගත් ජනයාගෙන් පිරි බස් රථ, වෑන් රථ, වෙනත් මෝටර් රථ, දුම්රිය, ත්‍රිරෝද රථ, මෝටර් බයිසිකල් ආදියේ ගමන් කල සියළු දෙනා පාහේ මහ මුහුදට ගසාගෙන ගියහ. බස් රථ ගිනිපෙට්ටි මෙන් වතුරේ පාවී ගියේය. මියගිය අය අතර කුඩා දරුවන්, වැඩිහිටියන්, තරුණ තරුණියන්, හිමිවරුන්, පූජකයන්, සංචාරකයන්, රෝගීන්, වෙළඳුන් ආදී විවිධ තරාතිරමේ මිනිසුන් දස දහස් ගණනකි. වෙරළ තීරයේ පිහිටි කුඩා

මහා මාර්ග පාලම් දෙදරා බිඳී කැඩී ගොස්ය. මහා මාර්ග පැලී ඉරිතලා ගොස්ය. මුළු වෙරළ තීරයම මහා විලාපයකි.

සිදුව ඇති දේපල විනාශය කිසිසේත්ම මුදලින් තක්සේරු කල නොහැකි තරම්ය. ත්‍රිකුණාමලය, මඩකලපුව පෙදෙස්වල තිබූ සමහර ගම් තිබූ තැන් සොයාගැනීමටත් නොහැකිය. ධීවර කර්මාන්තයේ යෙදී සිටි පිරිස් එහෙමපිටින්ම අතුරුදන්ව ගියහ.

පැය 12 ක් තුල වියරු වැටී සිටි මහ මුහුද ඉන්පසු නිහඩ විය. සාමාන්‍ය තත්වයට පත්විය. එහෙත් ගොඩබිමට හා එහි සිටි මිනිසුනට සිදුව ඇති හානිය කියා නිම කල නොහැක.

මගේ නිගමනයෙහි හැටියට අඩුම තරමින් පුද්ගලයන් 100000 වත් මුහුදට බිලිවන්නට ඇත.

2004 දෙසැ. 29 දා රාත්‍රී 8.00 ජාතික රූපවාහිනී පුවත් මගින් මියගිය සංඛ්‍යාව 33000 ක් බව ප්‍රකාශ කලේය. එහෙත් තවත් කොපමණ මල සිරුරු මහ මුහුද තුල ඇත්ද? විනාශ වී යන්නට ඇත්ද?

මිනිස් පවුල් ඒකක ලක්ෂ 3 ක් පමණ උන්හිටි තැන් නොමැතිව අවතැන්ව සිටිති. ඔවුන්ගේ නිවෙස්, පැල්පත්, කුඩාරම්, ගව මඩු, එළු ආදී සතුන්ද මහ මුහුදට බිලිවිය.

මේ වේලාවෙහි ශ්‍රී ලංකා ජනාධිපතිනිය අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය සිටියේ විදේශගතවය. මේ ඛේදනීය පුවත ඇසූ සිටි තැනම සිට රට හදිසි ආපදා තත්වයකට නම් කොට සියළු සහන සේවා සැලසීම සඳහා රජ්‍ය නිලධාරීන් මැති ඇමතිවරුන් පත්කොට හදිසි ආපදා කලමණාකරණ සේවා ක්‍රියාත්මක කළාය. අනතුරුව වහාම සිය රට බලා පැමිණියාය.

රූපවාහිනී රේඩියෝ ආදී මාධ්‍ය ජාලයන්ද වහා ක්‍රියාත්මක විය. ඛේදවාචකයට ගොදුරු වූ වෙරළ තීරය රූපගත කිරීමට, කැමරා කාචවලට හසු කර ගැනීමට ගිය මාධ්‍යවේදීන් කිප දෙනෙක් ජල රකුසාට හසුවිය.

පරපුරේ ද දැනුවත් භාවය උදෙසා මෙසේ ලියා තැබිය යුතු යැයි මම

සිදුවූ මහා ඛේදවාචකයට විසඳුම් පිණිස රට රටවලින් හෙලිකොප්ටර්, ආහාරපාන, බෙහෙත්, ඇඳුම් පැලඳුම්, ජලය ආදි සහනාධාර ලැබෙමින් පවතී. අපේ සහෝදර ජනතාව වහා ක්‍රියාත්මක වී එක් දිනකින්ම ආහාරපාන, රෙදිපිළි වැනි අත්‍යවශ්‍ය දෑ ලොරි සිය ගණනින් රැගෙන ගොස් අනාථ වූවන්ට බෙදා දුන්හ. මේ සිද්ධිය සිදුවී මේ මොහොත වන විට දින 03 කි. (2004. 12. 29) තවමත් සහනාධාර අති විශාල මට්ටමින් රැස් කිරීම, බෙදාදීම සිදුවෙමින් පවතී.

මට මේ අවස්ථාවේ විහාර මහ දේවි පුරාවෘත්තය සිහිපත් වේ. විහාර මහා දේවිය පිළිබඳ පුරාවෘත්තය තුල ප්‍රසිද්ධ කාරණා කීපයක් වෙයි. එකක් නම් ඇය මෙබඳුම මුහුද ගොඩගැලීමේ තත්වයක් තුල දේශය බේරාගැනීම උදෙසා සිය කැමැත්තෙන් මහ මුහුදට බිලිවීමට ඉදිරිපත් වූ බවයි. එහෙත් එදා කැළණිතිස්ස රජු සිය දියණියට තිබූ ආදරය නිසා ඇය මුහුදට බිලි නොකොට පහුරක් මත කැළණි ගඟ ඔස්සේ මුහුදට පා කර හැරිය.

මෙය සිදුවී සියවස් ගණනාවකි. එදා කැලණිතිස්ස රජ මුහුදු රකුසාගෙන් වූ මෙබඳු මහා ජල ගැල්මකින් රාජ්‍යය බේරාගැනීම උදෙසා වූ පූජාවකට තම දියණිය වූ විහාරමහා දේවි කුමරිය කැළණි ගඟ ජලය මතින් මහ මුහුදට පා කර හැරි බවට ඉතිහාසයේ සඳහන් වන්නේ එහෙයිනි.

නූතන පරපුරේ සමහර උදවිය මේ කතා පුවත උපහාසයට ලක් කරති. එය දැන්වත් නතර කළ යුතුව ඇතැයි මම මේ මොහොතේ පෙන්වා දීමට කැමැත්තෙමි.

කැළණිතිස්ස රජතුමා ස්වකීය ආදරණීය දියණිය දේවි කුමරිය පහුරකට නංවා මහ මුහුද වියරු වැටුනු අවස්ථාවේ පා කර හැරියේ දෛවඥයන් කී පරිදි දේශය කිසියම් සාපයකින් බේරා ගැනීමේ උතුම් අධිෂ්ඨානයෙන් බව කියැවේ. සිය පියාණන්ගේ අධිෂ්ඨානය හා ස්වකීය මවුබිම වෙනුවෙන් සිය දිවි නොතකා වියරු මුහුදට බිලිවන්නට තරම් එඩිතර, නිර්භීත කාන්තාවක් ගැන අසා තිබේද? අප මේ පුරා වෘත්තයන්හි අගය තවත් වසර දහස් ගණනක් අනාගතයේ උපදින

පරපුරේ ද දැනුවත් භාවය උදෙසා මෙසේ ලියා තැබිය යුතු යැයි මම විශ්වාස කරමි.

එදා විහාර මහා දේවිය ජල රකුසාට බිලිවූයේ නැත. මුහුදේ පාවී ගොස් දකුණු ලංකාවේ කිරින්ද වෙරලට කුමරිය නැගිගිය පහුර ගොඩ ගසා තිබේ. රූමත් කුමරිය සහිත යාත්‍රාව දැක බලාගන්නට පැමිණි එම පළාතේ රාජ්‍ය කල කාවන්තිස්ස කුමරු පැමිණ තිබේ. විහාරමහා දේවි කුමරියත්, කාවන්තිස්ස රජකුමාත් එක් නොවන්නට අපට දුටුගැමුනු කුමරු හමු නොවනු ඇත. දුටුගැමුණු කුමරු නොමැති තැන අහසට නැංවූ චෛත්‍ය, සාගරය වන් මහ වැව් නිර්මාණය වේද? රුවන්වැලි සෑය, තිසාවැව ආදී බෞද්ධ ඉතිහාසයේ වූ සියළු මහා නිර්මාණත්. සිදුවූ අපරිමිත බෞද්ධ ප්‍රබෝධනයත් බෞද්ධ ඉතිහාසයේ සිදු වූ මහා පුනර්ජීවනයත් සිදුවේද?

මහ මුහුද හඬා වැටෙන තරමට කෙරෙන අපරාධ, මිනිමැරුම් මහා පරිමාණ සත්ව ඝාතන, සොබාදහම් විනාශය ඉදිරියේ මහ මුහුද වියරු වූවාවත්ද?

සමස්ථ ජාතිය නැගිටීමට බොහෝ කලක් ප්‍රමාද විය හැකිය. දේශය වෙනුවෙන් බොහෝ දේ කැප කිරීමට සිදුවනු ඇත.

"නොසිඳි නිම්නය" කෘතිය කෙරෙහි මාතෘකා නොවූවත් මා හුදකලාව මෙම කුඩා කෘතියට කරුණු එක්කාසු කොට ගොනුකොට ලියා මුද්‍රණය කරන අවස්ථාවේ සිදු වූ මේ මහා ඛේදවාචකය ගැන මතු පරපුරේ දැනගැනීම සඳහා මෙබඳු සටහනක් තබන්නට මට සිත්විය.



2004 ජනතා ජයග්‍රහණය...

එක්සත් ජනතා නිදහස් සන්ධානයේ නිර්මාතෘ

ගරු. අමාත්‍ය

ජනාධිපති ලේකම් කාර්යාලය
25 JAN 2005
පුස්තකාලය

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

REFERENCE

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

REFERENCE

# නොසිඳි නිම්නය

## ඝාතනයෙන් නොනැවතුණු ජනබලය



කිසියම් පුද්ගලයෙකුගේ ජීවිතය බේරාගැනීමට හැකිවීමේදී ලබන සතුට තරම් සතුටක් තවත් තිබිය නොහැක. විශේෂයෙන් ජන නායිකාවකගේ දිවි බේරාගැනීමට යම් පුද්ගලයෙකුට හැකිවන්නේ නම් එම සතුටේ උපරිමය කොතෙක්ද ?

මම ඒ භාග්‍යය ලැබුවෙමි. ත්‍රස්ත බෝම්බයකින් ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ජීවිතය බේරාගැනීමට මට හැකිවීම මා ජීවිතයේ ලැබූ ලොකුම භාග්‍යයයි.

මගේ ජීවිතයේ මා ලද උපරිම සතුටට හේතු වූ කාරණා අතර දෙවැන්න නම් මාගේ පුත් අර්ජුනගේ නායකත්වයෙන් යුතු ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ලෝක කුසලානය ශ්‍රී ලංකාවට හිමිකර දීම වෙනුවෙන් සහෝදර ජනතාව සමග සතුටු වූ අවස්ථාවයි.

- රෙජී රණතුංග

හංසප්‍රභා මුද්‍රණ සහ ප්‍රකාශන
කොරගෙ, උඩුගම්පොළ.

දුර. 0777-445301